**ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය හා එහි පරිපාලිතයන් - 2024**

**-----------------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ (“අධිකාරිය”) සහ පරිපාලිතයන්ගේ (“සමූහය”) 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ,1979 අංක 23 දරන ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළයුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මාගේ වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අධිකාරියේ හා සමූහයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අධිකාරිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උපවගන්තිය ප්‍රකාරව අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳ අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදි.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අධිකාරියේ කාර්යයන් අඛණ්ඩව ඇගැයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේද යන බව,

- යම් අදාල ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව සමාගම ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාල නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.5.1 ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය**

**1.5.1.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූල නොවීම**

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 හි 79 ඡේදය ප්‍රකාරව බී කලාපයේ රු.මිලියන 51.24 ක් වටිනා දින 400 ක ස්ථාවර තැන්පතු ජංගම නොවන වත්කම් ලෙස දැක්විය යුතු වුවද, කෙටිකාලීන තැන්පතු යටතේ දක්වා තිබුණි. | 2025 වර්ෂයේ බී කලාපයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරිමේදී නිවැරදි කරමි. | ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව දින 400 ස්ථාවර තැන්පතු ජංගම නොවන වත්කම් ලෙස දැක්විය යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි 22 ඡේදය ප්‍රකාරව දේපල පිරියත හා උපකරණවල පසුකාලීන පිරිවැය එම වත්කම්වල අගය වැඩිවීමක් ලෙස හඳුනා ගතයුතු වුවද, බෝවතැන්න කාර්යභාර ඉංජිනේරු කාර්යාලයේ රු.මිලියන 4.83 ක්, ඒ කලාපයේ කාර්යයන් තුනකට අදාළ රු.මිලියන 2.35 ක්, වලව කලාපයේ කොන්ත්‍රාත් 07 කට අදාළ රු.මිලියන 17.09 ක් හා ප්‍රධාන කාර්යාලයේ රු.මිලියන 2.04 ක් වූ ප්‍රාග්ධන ස්වරූපයේ වියදම් ප්‍රාග්ධනිත නොකර අයභාර වියදම් ලෙස දක්වා තිබුණි. | මෙය 2025 මූල්‍ය ප්‍රකාශන මඟින් නිවැරදි කිරිමට කටයුතු කරමි. | ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව ප්‍රාග්ධන වියදම් අදාළ වත්කම්වල අගය වැඩිවීමක් ලෙස හඳුනාගත යුතුය. |
| (ඇ) | එල් කලාපයේ හා වලව කලාපයේ ඉඩම් පරිහරණ ගාස්තු හා වික්ටෝරියා කලාපයේ උකුවෙල වාරියපොල වත්ත පිහිටි ඉඩමෙන් 2001 ඔක්තෝබර් 19 දක්වා කඩා ඉවත් කරන ලද හුණුගල් සඳහා අයවියයුතු සේවා ගාස්තුව හා හිඟ බදු හා සී, එල්, එච් හා වලව කලාපවල කළුගල් කැනීම් වෙනුවෙන් අය විය යුතු ගාස්තු එකතුව රු.මිලියන 330.52 ක් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 10 හි 33 ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල ලැබිය යුතු ශේෂ ලෙස හඳුනාගෙන නොතිබුණි. | හිඟ ඉඩම් පරිහරණ ගාස්තු, හුණු ගල් සඳහා අයවිය යුතු ගාස්තු සහ හිඟ බදු මුදල් සඳහා අයවිය යුතු ගාස්තු ඉදිරි මූල්‍ය ප්‍රකාශනවල "ලැබිය යුතු ශේෂ" ලෙස හඳුනාගැනීමට කටයුතු කරමි. | ලැබිය යුතු ආදායම් ලෙස ඉඩම් පරිහරණ ගාස්තු, කළුගල් හා හුණුගල් සඳහා අය වියයුතු ගාස්තු හඳුනාගෙන ගිණුම්ගත කර අයකර ගැනීමට කටයුතු කළයුතුය. |
| (ඈ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 11 හි 48 ඡේදය ප්‍රකාරව හුවමාරු නොවන ගනුදෙනුවලින් වන අයභාරය, අස්ථිත්වය විසින් හඳුනාගත් ශුද්ධ වත්කම්වල වැඩිවීමේ වටිනාකමට හඳුනාගත යුතු වුවත්, වෙලි ආරක්ෂණ හා ජල සම්පත් සැලසුම්කරණ ව්‍යාපෘතිය මඟින් මහවැලි අධිකාරිය විසින් | දරා ඇති ප්‍රාග්ධන වියදම් එකී ව්‍යාපෘතියෙන් තහවුරු කරගෙන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 11 හි 48 ඡේදය ප්‍රකාරව ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මඟින් ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කරමි. | ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව ව්‍යාපෘතිය විසින් අධිකාරියේ වෙලි හා සම්බන්ධිත දරන ලද වියදම් හඳුනාගෙන |

| | | | |
|---|---|---|---|
| | නඩත්තු කරන වේලි සඳහා වැයකරන ලද රු.මිලියන 4,394.97 ක වියදම් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | | ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කළයුතුය. |
| (ඉ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 13 හි 09 ඡේදයට අනුව බදු කුලී ඉපයීම සඳහා තබා ගෙන ඇති දේපල, ආයෝජන දේපල ලෙස හඳුනාගත යුතු වුවත්, බාහිර ආයතනවලට කුලී පදනම මත ලබා දෙන ලද ගොඩනැගිලි 05 කට අයත් ඉඩම් සඳහා වූ තක්සේරු වටිනාකම ආයෝජන දේපල ලෙස හඳුනාගෙන නොතිබුණි. | ආයෝජන කටයුත්තක් වෙනුවෙන් ලබාදී ඇත්තේ ලංකා බැංකුව (දිගන විලේජ් ශාඛාව) වෙත පමණක් බවත් එම ආදායම 2025 වර්ෂයේදී ආයෝජන දේපල ලෙස ගිණුම් ගත කිරීමට කටයුතු කරනු ලැබේ. | ප්‍රමිතිය ප්‍රකාර කුලී පදනම මත ලබාදෙන ලද ගොඩනැගිලිවලට අයත් ආයෝජන දේපල හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කළයුතුය. |
| (ඊ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 13 හි 44 ඡේදය අනුව ආයෝජන දේපල සාධාරණ අගයේ වෙනස්වීම තුළින් පැන නගින වාසි හා අවාසි එය පැන නගින කාලපරිච්ඡේදයේ අතිරික්තයට හෝ ඌනතාවයට හඳුනාගත යුතු වුවත්, බී කලාපයේ මූල්‍ය ප්‍රකාශනවල ආයෝජන දේපලවල සාධාරණ අගයේ වැඩිවීම රු.මිලියන 256.25 ක් ප්‍රත්‍යාගණන සංචිත යටතේ දක්වා තිබුණි. | වත්කම්වල සාධාරණ අගය සටහන් කිරීමේ දෝෂය 2025 මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. | ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව ආයෝජන දේපලවල සාධාරණ අගය වැඩිවීම අදාළ කාලපරිච්ඡේදයේ අතිරික්තය හෝ ඌනතාවයට හඳුනාගත යුතු බැවින්, එම වටිනාකම ප්‍රත්‍යාගණන සංචිතයෙන් ඉවත් කළයුතුය. |
| (උ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 19 හි 61 ඡේදය ප්‍රකාරව නිර්වචිත ප්‍රතිලාභ සැලසුම ලෙස හඳුනා ගෙන තිබූ සේවක පාරිතෝෂික ප්‍රතිපාදනය ආයුගණක ශිල්ප ක්‍රම භාවිතා කර හඳුනා ගැනීම හා මැනීම සිදුකළයුතු වුවත් ආයතනය ඊට අනුකූලවී නොතිබුණි. | ඉදිරියේදී මේ සම්බන්ධව කටයුතු කිරීමට සටහන් කර ගන්නා ලදි. | ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව පාරිතෝෂික ප්‍රතිපාදන ආයුගණන ශිල්ප ක්‍රමය භාවිතා කර හඳුනා ගැනීම හා මැනීම කළයුතුය. |
| (ඌ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 18 හි 13 ඡේදය ප්‍රකාරව ජෛව වත්කම් හඳුනාගැනීමේදී වත්කමේ සාධාරණ වටිනාකම හා පිරිවැය විශ්වාසදායක ලෙස මැනිය යුතු වුවද, එසේ නොකර බී කලාපයේ මූල්‍ය ප්‍රකාශන තුළ ජෛව වත්කම්වල වෙළෙඳ තොගය ලෙස දක්වා ඇති අරලගංවිල ගොවිපලේ, මධ්‍යම පැල තවානේ හා වැලිකන්ද පැල තවානේ පැල හා ගස්වල වටිනාකම ගොවිපල කළමනාකරු විසින් ලබාදුන් වටිනාකම් පදනම් කරගෙන රු.මිලියන 10.8 ක් ලෙස ගිණුම් ගත කර තිබුණි. තවද | 2025.12.31 දිනට භෞතික තොගය කමිටුවක් මගින් ගණනය කර වටිනාකම පොත්වලට ඇතුළත් කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව ජෛව වත්කම් හඳුනා ගැනීමේදී වත්කමේ සාධාරණ වටිනාකම හා පිරිවැය විශ්වාසදායක ලෙස මැනීමටත් මූල්‍ය ප්‍රකාශනවල |

| | | | |
|---|---|---|---|
| | දෙහිඅත්තකන්ඩිය පැල තවානේ පැල තොගය ජෛව වත්කම් ලෙස හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. | | ඉදිරිපත් කිරීමටත් කටයුතු කළයුතුය |
| (එ) | වලව විශේෂ බලප්‍රදේශයට අයත් දොඹකර යන්ත්‍රයක් 2014 සැප්තැම්බර් 07 දින අනතුරකට ලක්වී තිබුණද එය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 36 හානිකරණ ප්‍රමිතය අනුව හානිකරණ අලාභය ගණනය කර වාර්තා කිරීමට කටයුතු නොකර 2024 දෙසැම්බර් 31 දිනට එහි පිරිවැය රු.මිලියන 45 ක් හා ශුද්ධ පොත් අගය රු.මිලියන 24.75 ලෙස දක්වා තිබුණි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 36 ට අනුව හානිකරණ අලාභය ගණනය කර 2025 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මඟින් නිවැරදි කිරීමට කටයුතු කරමි. | ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව හානිකරණ අලාභය ගණනය කර වාර්තා කළ යුතුය. |

### 1.5.1.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මහවැලි සී කලාපයේ වර්ෂ 2016-2018 කාලපරිච්ඡේදයට අදාළව මංකඩලාභීන් 401 දෙනෙකුගෙන් ලැබිය යුතු හිඟ ඉඩම් පරිහරණ ගාස්තු රු.මිලියන 278.69 ක්, 2024 දෙසැම්බර් 31 දිනට භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙන් සී කලාපයට අයවිය යුතු ඉඩම් පරිහරණ ගාස්තු රු.මිලියන 19.76 ක් හා වලව කලාපයේ පුද්ගලික සමාගමකින් පස් කැපීම් සඳහා වූ හිඟ ඉඩම් පරිහරණ ගාස්තු රු.මිලියන 10.65 ක් ලෙස එකතුව රු.මිලියන 309.10 ක් ලැබිය යුතු ශේෂ ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | සී කලාපයේ වැලි මංකඩලාභීන් වෙතින් අයවීමට පවතින හිඟ මුදලද භූ විද්‍යා හා පතල් කැනීම් කාර්යාංශය මඟින් කලාප වෙත අයවිය යුතු රු.19,759,220 ක ඉඩම් පරිහරණ ගාස්තුද 2025.12.31 දිනට මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී ගිණුම් ගත කිරීමට කටයුතු කරමි.<br><br>වලව කලාපයේ සමාගමකින් අය වීමට ඇති රු.10,640,720 ක මුදල අය කර ගැනීමට පොදු දේපල පනත යටතේ පැමිණිලි ගොනු කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.<br><br>ගිණුම් ගතවී නොමැති හිඟ ඉඩම් පරිහරණ ගාස්තු පිලිබඳව සොයා බලා ලැබිය යුතු හිග ඉඩම් පරිහරණ ගාස්තු 2025 වර්ෂයේදි ගිණුම් ගත කිරීමට කටයුතු කරමි. | ලැබිය යුතු ඉඩම් පරිහරණ ගාස්තු ආදායම් හඳුනාගෙන ගිණුම්ගත කිරීමට හා හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළයුතුය. |
| (ආ) | මහවැලි මහ සැලැස්ම යටතේ හඳුනාගෙන තිබූ ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 13,853 ක් වූ උමාඔය බහුකාර්ය සංවර්ධන යෝජනා ක්‍රමයේ ඉදිකිරීම් 2023 වර්ෂයේ අවසන් කර, විදුලි ජනන කටයුතු 2024 මාර්තු 31 ආරම්භ කර තිබුණි. එසේ වුවද එම සංවර්ධන යෝජනා ක්‍රමය යටතේ වන ඉදිකිරීම් තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | උමාඔය බහුකාර්ය සංවර්ධන යෝජනා ක්‍රමය යටතේ අධිකාරිය වෙත භාර දිය යුතු ප්‍රධාන වේලි හා ජලාශ ආශ්‍රිත ස්ථාවර වත්කම්වල ඇතැම් කොටස් සම්පූර්ණ වශයෙන්ම විධිමත් පරිදි භාරදීම අවසන් කර නොමැත. අදාළ වත්කම් විධිමත්ව භාර දී අවසන් කළපසු ගිණුම්ගත කිරීමට කටයුතු කරමි. | කඩිනමින් මෙම වත්කම් විධිමත්ව භාරගැනීමටත්, ගිණුම්ගත කිරීමටත් කටයුතු කළයුතුය. |
| (ඇ) | අධිකාරිය සතු 3001 අරමුදල් ගිණුමේ ශේෂය තුළ වසර ගණනාවක් තිස්සේ පැවත එන එකතුව | මෙම ශේෂයන් පිළිබඳව කරුණු සොයා බලා තහවුරු කරගෙන | මෙම හර හා බැර ශේෂ හඳුනාගෙන |

| | | | |
|---|---|---|---|
| | රු.මිලියන 560.76 ක් වූ හර ශේෂ හා එකතුව රු.මිලියන 509.1 ක් වූ බැර ශේෂ හඳුනාගෙන අදාළ ගිණුම්කරණ ගැලපීම් සිදුකිරීමට කටයුතු කර නොතිබුණි. | ගිණුම්කරණ ගැලපීම් ඉදිරි වර්ෂයේදී සිදුකිරීමට සටහන් කර ගතිමි. | ගිණුම්ගත කිරීමට කටයුතු කළයුතුය. |
| (ඇ) | අධිකාරිය විසින් 1984-1989 වර්ෂවලදී මිලදීගෙන තිබුණු පිරිවැය රු.මිලියන 64.32 ක් වූ ඉඩම් කට්ටි 2 ක්ද, කොත්මලේ කණිෂ්ඨ කඳවුරේ ජේලි නිවාස 54 ක් ද, අධිකාරියේ කලාප කාර්යාල, අංශයන්, නිල නිවාස සහ සංචාරක බංගලා ආදිය පිහිටි ඉඩම් හඳුනාගෙන ඒවායේ වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි. | මිනුම් කටයුතු සහ තක්සේරුව සඳහා මූල්‍ය ප්‍රතිපාදන වෙන් කර දීමෙන් පසු අදාළ කාර්යය කඩිනම් කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | අධිකාරිය සතු ඉඩම් සහ ගොඩනැගිලි හඳුනාගෙන ගිණුම්ගත කළයුතුය. |
| (ඉ) | අධිකාරිය වෙත වේලි ආරක්ෂණ හා ජල සම්පත් සැලසුම්කරණ ව්‍යාපෘතියෙන්, මොරගහකන්ද ව්‍යාපෘතියෙන් සහ දේශගුණික අවබලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතියෙන් පිළිවෙලින් ලද රු.මිලියන 82 ක, රු.මිලියන 69.64 ක හා රු.මිලියන 247 ක වත්කම් ගිණුම්ගත කර නොතිබුණු අතර, තඹුත්තේගම යාන්ත්‍රික වැඩපල භාරයේ පවතින මොරගහකන්ද ව්‍යාපෘතියෙන් ලද වාහන 16 ක් ද තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | උක්ත ව්‍යාපෘති මඟින් එලෙස වත්කම් ලබා දී ඇති බව පැවසුව ද විධිමත් ක්‍රමවේද මත ලැබී ඇති භාණ්ඩ ලැබීම් පත් නිකුත් කරන ලද සියළු වත්කම් අධිකාරියේ ගිණුම්වලට ගලපා ඇත.<br><br>මෙම වාහන අධිකාරිය වෙත පවරා දෙන ලෙස රේඛීය අමාත්‍යාංශ ලේකම් වෙත ඉල්ලීමක් කර ඇති අතර, අනුමැතිය ලැබුණු පසු එකී වාහන 16 තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කරමි. | මෙම ව්‍යාපෘතිවලින් ලැබී ඇති සියළු වත්කම් නිසි පරිදි හඳුනාගෙන ගිණුම්ගත කළයුතුය. |
| (ඊ) | පහළ කොත්මලේ ඔය කුඩා පරිමාණ ජල විදුලි බලාගාරයෙන් 2021 සිට 2024 දක්වා වූ වර්ෂ සඳහා ලැබිය යුතු ආදායම් ගණනය කර 2024 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගිණුම් ගත කර නොතිබුණි. | 2025 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මඟින් නිවැරදි කිරීමට කටයුතු කරමි. | මෙම ජල විදුලි බලාගාරයෙන් ලැබිය යුතු ආදායම් ගණනය කර ගිණුම්ගත කිරීමට කටයුතු කළයුතුය. |
| (උ) | අධිකාරිය විසින් බදු අයකර ගතහැකි ඉඩම් හෙක්ටයාර 18766 ක් 2023 වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිට බැහැර කර තිබුණද, එයින් තක්සේරු වටිනාකම රු.මිලියන 2810.49 ක් වූ ඉඩම් හෙක්ටයාර 6114.21 ක් පමණක් ගිණුම්ගත කර තිබුණි. | රජයේ තක්සේරු ලබා ගැනීම සඳහා ඉඩම් කොටස් මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් මැන සැලසුම්පත් සකස් කළයුතු වන අතර මේ වන විට ව්‍යවස්ථාපිත පිඹුරු සකස් කිරීම් ප්‍රමාදයක් පවතින අතර, ඉඩම්ලාභීන්ගේ භුක්තිය සනාථ වන ලේඛන ලබා ගැනීමට ප්‍රමාද වීම, තක්සේරු සේවා ගාස්තු ගෙවීමට ඉඩම්ලාභීන් කැමැත්ත නොදැක්වීම, ඉඩම්ලාභියා වෙත නීත්‍යානුකූල ලේඛනයක් නිකුත් කිරීමට ප්‍රමාදවීම, බැහැර කර ඇති ඉඩම් කොටස් සංවර්ධනය නොකිරීම, ලබා දී ඇති කාර්යයට ඉඩම් කොටස් යොදා නොගැනීම ආදී කරුණු ඉඩම්වලින් | ගිණුම්ගත නොකරන ලද අධිකාරිය සතු බාහිර පාර්ශවයන්ට බැහැර කර ඇති ඉඩම් තක්සේරු කර ගිණුම්ගත කළයුතු අතර, ඒ සඳහා අයවිය යුතු බදු මුදල්ද අයකර ගතයුතුය. |

| | | | |
|---|---|---|---|
| | | අයවිය යුතු මුලු බදු ප්‍රමාණය අඩුවීමට බලපා ඇත. | |
| (ඌ) | සූර්ය පැනල, ඉන්වර්ටරය සහ පද්ධතියේ නිෂ්පාදන ධාරිතාවය සඳහා වගකීම් කාලය පිළිවෙලින් අවුරුදු 20 ක්, අවුරුදු 07 ක් හා අවුරුදු 25 ක් වුවද ඒ පිළිබඳ ද සැලකිලිමත් නොවී බී කලාපය තුළ කිලෝ වොට් 30 සූර්යබල පද්ධතියක් 2021 වර්ෂයේදී රු.මිලියන 5 ක් ලෙස ජෙනරේටර් යටතේ ගිණුම්ගත කර සියයට 15 අනුපාතයට ක්ෂය කර තිබුණි. | 2025 වර්ෂයේ දී මෙම සූර්ය පැනල පද්ධතිය යන්ත්‍රෝපකරණ - සාමාන්‍ය (Plant Machinery and Equipment – General) යන කාණ්ඩය යටතේ දක්වා ක්ෂය කිරීමට කටයුතු කර ඇති බව දන්වමි. | ගිණුම්කරණ වරද නිවැරදි කළයුතුය. |
| (එ) | වෙනත් කලාපවල වාහන අළුත්වැඩියා කිරීම වෙනුවෙන් යාන්ත්‍රික වැඩපලට ලැබිය යුතු රු.මිලියන 1.85 ක් එම් කලාපයේ මූල්‍ය ප්‍රකාශනවල ප්‍රාග්ධන ස්වරූපයෙන් කෙරීගෙන යන වැඩ යටතේ දක්වා තිබුණි. | 2025 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මඟින් නිවැරදි කරමි. | ගිණුම්කරණ වරද නිවැරදි කළයුතුය. |
| (ඒ) | ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ කොටස් හිමිකාරීත්වය යටතේ තිබූ මහවැලි වෙන්චර් කැපිටල් (පුද්) සමාගම 2024 නොවැම්බර් 25 දින ගණන් බේරා ඈවර කිරීමේදී එම සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව තිබූ රු.මිලියන 18.05 ක් වූ මුදල් ශේෂ මහවැලි අධිකාරියේ ගිණුම්වලට මාරු කර තිබුණි. එසේ වුවද, භෞතිකව නොමැති බවට ඈවරකරුවන් දන්වා එවා තිබූ හා සමාගම ඈවර කිරීමේදී තාවකාලික වත්කම් ගිණුමකට මාරු කර තිබූ රු.මිලියන 3.32 ක ශේෂ 08 සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන අවශ්‍ය කටයුතු කර නොතිබුණ අතර ඒ සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශන තුල හෙළිදරව් කිරීමක්ද කර නොතිබුණි. | සමාගම ඈවර කිරීමේදි භෞතිකව නොමැති බව නිරීක්ෂණය කර ඈවරකරුවන් විසින් ලිඛිතව දන්වා තිබූ රු.3,322,745 ක ශේෂ සම්බන්ධ විස්තර අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කර එහි තීරණ මත 2025 මූල්‍ය ප්‍රකාශන මගින් හෙළිදරව් කිරීමට කටයුතු කරමි. | අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත භෞතිකව නොමැති ශේෂ සම්බන්ධ-යෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගතයුතු අතර, ඒ පිළිබඳව ගිණුම්වලින් හෙළිදරව් කළයුතුය. |
| (ඔ) | ගොඩනැගිලිවලට අමතරව දෙමටගොඩ පිහිටි ඉඩමෙහි වටිනාකම වූ රු.මිලියන 296 ක් සඳහා ද ප්‍රධාන කාර්යාල පරිශ්‍රය පිහිටි අංක 493 හා 1/493 දරන ඉඩම්වල වටිනාකම රු.මිලියන 1,151 ක් සඳහා ද සියයට 5 ක් එනම් රු.මිලියන 72.35 ක් ක්ෂය කර තිබුණෙන් ක්ෂය වියදම එම අගයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | අධිකාරියේ ප්‍රධාන කාර්යාලයේ ස්ථාවර වත්කම් ලේඛනය තුළ කාර්යාල නොවන ගොඩනැගිලි සහ ඉඩම් වටිනාකම එකම ස්ථාවර වත්කම් කාණ්ඩයක් යටතේ පවත්වාගෙන යාම නිසා (BD ලෙස) එම ගොඩනැගිලි සහ ඉඩම් යන කොටස් දෙකම 5% ක අනුපාතයකින් වැරදීමකින් 2024 වර්ෂයට ක්ෂය කර ගිණුම් ගත කර ඇත. | ගිණුම්කරණ වරද නිවැරදි කළයුතුය. |
| (ඕ) | 1986 වර්ෂයේ සිට මහවැලි අධිකාරිය සතුව පැවති ප්‍රධාන කාර්යාල පරිශ්‍රයෙහි වරිපනම් අංක 500, 1/500 දරන හෙක්ටයාර 0.264 ක් වූ ඉඩම අගය කර ගිණුම්ගත කර නොතිබුණි. | කැබලි අංක 01 හි මායිම් භෞතිකව වෙනස්වී ඇති බැවින් හා කැබලි අංක 02 (1/500) හි අයිතිය ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සතු නොවන බැවින්, රජයේ තක්සේරුකරු විසින් ගොඩනැගිලි වටිනාකම පමණක් | මෙම ඉඩමේ අගය ගිණුම්ගත කළයුතුය. |

| | | | |
|---|---|---|---|
| | | තක්සේරු කර එවා ඇත. එබැවින්, ඉඩමේ වටිනාකම ගිණුම්ගත කිරීමට නොහැකිවූ අතර, මායිම් නිවැරදිව නැවත සකස් කර, තක්සේරු කර 2025 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සඳහා ඇතුළත් කිරීමට කටයුතු කරමි. | |
| (ක) | ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් හා අධ්‍යක්ෂ (ආයතන සංවර්ධන) යන අයට නිකුත් කර තිබූ රු.මිලියන 1.5 ක ස්ථාවර වත්කම් හා වට්ටෝරු භාණ්ඩ අයිතම 08 ක් අධිකාරියට ආපසු භාරනොදීම හේතුවෙන් සියයට 25 ක් එනම් රු.376,129 ක් ආයතනික ගාස්තුව සමඟ රු.මිලියන 1.88 ක් ඔහුගේ පාරිතෝෂික මුදලින් අඩු කිරීමට 2024 වර්ෂයේදී කටයුතු කර තිබුණි. එසේ වුවද, අධිකාරියට සිදුවූ ලාභය ප්‍රවර්තන වර්ෂයට ගැලපීමට කටයුතු කර නොතිබුණු අතර, එම වත්කම්වල වටිනාකම් 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලින් ඉවත් කර නොතිබුණි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 03 ට අනුව පූර්ව වර්ෂ ගැලපීම් ලෙස 2025 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මඟින් නිවැරදි කිරීමට කටයුතු කරමි. | අධිකාරියට සිදුවූ ලාභය ගිණුම්ගත කර වත්කම්වල වටිනාකම මූල්‍ය ප්‍රකාශනවලින් ඉවත් කළයුතුය. |

**1.5.1.3 නොසැසඳුනු පාලන ගිණුම් හා වාර්තා**

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | එච් කලාපයේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් සියයට 50 දායකත්වය යටතේ විවිධ කෘෂි වැඩසටහන්වලට ගොවීන්ගෙන් එකතු කරගෙන 2021 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා රඳවාගෙන අදාළ ආයතනවලට නොගෙවා තබාගෙන ඇති මුදල රු.මිලියන 19.16 ක් වුවද, කෘෂිකර්ම අංශයෙන් ලබාගත් තොරතුරු අනුව එය රු.මිලියන 2.17 ක් වූයෙන්, රු.මිලියන 16.99 ක වෙනසක් විය. | කෘෂිකර්ම දෙපාර්තුමේන්තුව වෙත බීජ සඳහා ගෙවීමට 50% ගොවි දායකත්වය මත රඳවාගෙන තිබෙන රු.2,883,449 මුදල ලදුපත් ඉදිරිපත් කිරීමෙන් පසුව පරික්ෂා කර ගෙවීම් සිදු කරනු ලැබේ.<br><br>අදාළ වියදමට ගැලපිය යුතු රු.4,586,189 රඳවාගැනීමක් ලෙස සටහන් වී ඇත. 2025 වර්ෂයේදී අදාල වියදම් ගිණුමට ගැලපීම සිදු කරනු ලැබේ.<br><br>රු.11,689,134, 2024 වර්ෂයට අදාලව 50% ගොවි දායකත්වය මත අයකර රඳවාගත් මුදල් වන අතර ලදුපත් පරික්ෂා කිරීමෙන් අනතුරුව 2025 වර්ෂයේ රු.11,689,134 ගෙවීම් කටයුතු සිදු කරනු ලැබේ. | මෙම වෙනසට හේතු සොයා බලා අවශ්‍ය නිවැරදි කිරීම් කළයුතුය. |
| (ආ) | පුද්ගලික සමාගමකට ගෙවිය යුතු ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති ශේෂය රු.මිලියන 2.65 ක් වුවද අදාල සමාගම සම්බන්ධයෙන් ඉඩම් අංශයේ පවත්වාගෙන යනු ලබන ලිපිගොනුව අනුව | පුද්ගලික සමාගමට තවදුරටත් ගෙවිය යුතු ලෙස පවතින ශේෂය රු. 2,652,153 ක් වේ.<br>එමෙන්ම උප කොන්ත්‍රාත්කරුවෙකු පසුකාලීනව රු 3,516,598.39 ක | - එම - |

| | | |
|---|---|---|
| එම ශේෂය රු.මිලියන 3.52 ක් වූයෙන් රු.මිලියන 0.87 ක වෙනසක් විය. | බිල්පත් ඉදිරිපත් කර ඇති අතර, මෙම කොන්ත්‍රාත්කරු සමඟ ආයතනය ගිවිසුම් ගතවී නොමැති බැවින් මෙම ගෙවීම් සඳහාද ගැටලුකාරී තත්ත්වයක් තවදුරටත් පවතී. ඉඩම් අංශයේ ලිපිගොනු අනුව වාර්තා කර ඇත්තේ උප කොන්ත්‍රාත්කරුට අදාළ ගෙවිය යුතු ප්‍රමාණයයි. | |

### 1.5.1.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අධිකාරිය විසින් සී/ස මහවැලි සත්ව ව්‍යාපාරික (පුද්ගලික) සමාගමේ සිදුකළ රු.මිලියන 10 ක ආයෝජන වෙනුවෙන් කොටස් සහතික හා අධ්‍යක්ෂ මණ්ඩල තීරණ ද, කලංකුට්ටිය ගොවිපොල වෙනුවෙන් ලැබිය යුතු රු. මිලියන 14.64 ක් සඳහා බදු ගිවිසුම්ද, බී කලාපයේ ලැබිය යුතු ජල බිල්පත් ආදායම, ලැබිය යුතු තැන්පතු පොලී හා ගබඩා අයකර ගැනීම් එකතුව රු.මිලියන 7.3 ක් සඳහා උපලේඛනද, මඩාටුගම යාන්ත්‍රික වැඩපලේ ලැබිය යුතු ශේෂය, ගෙවිය යුතු ශේෂය හා ගෙවිය යුතු තැන්පතු ගිණුමේ ආරම්භක ශේෂය ලෙස එකතුව රු.මිලියන 14.82 ක පැවැත්ම තහවුරු කිරීමට ලිඛිත සාක්ෂි ද, ප්‍රධාන වේලි හා ජලාශ මෙහෙයුම් අංශයේ මූල්‍ය ප්‍රකාශනවල ලැබිය යුතු ශේෂ රු.මිලියන 1.24 ක ශේෂවල පැවැත්ම තහවුරු කිරීමට ලිඛිත සාක්ෂි ද, ඊ කලාපයේ හිඟ බදු රු.මි. 243.21 සඳහා බදු ලේඛනද යන සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය. | මෙම සමාගම මේ වන විට පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශය යටතේ ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ අධීක්ෂණය යටතේ පවතින සමාගමක් ලෙස ක්‍රියාත්මක වේ.<br>මෙම ගැටලු විසඳා ගැනීම සඳහා දෙපාර්ශවය අතර පවතින රාජකාරිමය ලිපි ලේඛන හුවමාරු කරගත් අතර ඒවා අධ්‍යනය කර මෙම ගැටළු විසඳා ගැනීමට අපේක්ෂා කරමි.<br>ඉතිරි ශේෂ සම්බන්ධව ඉදිරියේදී සොයාබලා අවශ්‍ය කටයුතු කිරීමට සටහන් කරගන්නා ලදි.<br>ඊ කලාපයේ හිඟ බදු ශේෂය ගණනය කිරීමේදී කාර්යාලයීය දෝෂයන් මත වික්ටෝරියා කොට්ඨාශයේ යම් ප්‍රමාදයක් සිදු වූ අතර මේ වන විට එය නිවැරදි කර ඉදිරිපත් කර ඇත. | මෙම ශේෂවල පැවැත්ම තහවුරු කිරීමට අවශ්‍ය ලේඛන විගණනයට ඉදිරිපත් කළයුතුය. |

### 1.5.2 සී/ස මහවැලි ලයිව්ස්ටොක් ඇන්ඩ් ඇග්රෝ එන්ටර්ප්‍රයිසස් (ප්‍රයිවට්) ලිමිටඩ්.

### 1.5.2.1 කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගිරාදුරුකෝට්ටේ ගොවිපොළෙහි අක්කර 1,113 රූඩ් 0 පර්චස් 37.76 ක ඉඩමේ වටිනාකම සහ දම්මින්න ගොවිපළෙහි අක්කර 100 ක ඉඩමේ වටිනාකම කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් සඳහා වූ ගිණුම්කරණ ප්‍රමිති 17.4 ඡේදය අනුව සමාගම විසින් ගිණුම්ගත කර නොතිබුණි. | ගිරාදුරුකෝට්ටේ ගොවිපොළ හා දම්මින්න ගොවිපොළේ ඉඩම් තක්සේරු කර සමාගම වෙත ශ්‍රී ලංකා මහවැලි අධිකාරියෙන් පවරා නොමැත. සමාගමට එම ඉඩම් පරිහරණය කිරීම සඳහා පමණක් ලබා දී ඇත. | ගිණුම්කරණ ප්‍රමිතිය ප්‍රකාරව ඉඩම්වල වටිනාකම් තක්සේරු කර ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් සඳහා වූ ගිණුම්කරණ ප්‍රමිත 10.21 අනුව පූර්ව වර්ෂ වැරදි සංසන්දනාත්මකව පූර්ව වර්ෂ | පිළිතුරු ඉදිරිපත් කර නැත. | ගිණුම්කරණ ප්‍රමිතිය ප්‍රකාරව පූර්ව වර්ෂ වැරදි සංසන්දනාත්මකව ගලපා |

| | | | |
|---|---|---|---|
| | සංඛ්‍යා සඳහා ගලපා මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළයුතු වුවත්, සමාගම ඒ අනුව කටයුතු කර නොතිබුණි. | | මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ යුතුය. |
| (ඇ) | පූර්ව වර්ෂ සඳහා වූ ගැලපුම් ලෙස අයභාර සංචිතයෙන් රු.13,454,122 ක් අඩුකර රු.7,402,549 ක් එකතු කර තිබුණද, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් සඳහා වූ ගිණුම්කරණ ප්‍රමිති 10.23 අනුව හෙළිදරව් කිරීම් සිදුකර නොතිබුණි. | 2025 වර්ෂයේ ඉදිරිපත් කරමි. | ගිණුම්කරණ ප්‍රමිතිය ප්‍රකාරව පූර්ව වර්ෂ සඳහා වූ ගැලපුම් හෙළිදරව් කළ යුතුය. |
| (ඈ) | කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් සඳහා වූ ගිණුම්කරණ ප්‍රමිති 28.18 අනුව පාරිතෝෂික ගණනයේදී ආයුගණක අගය කිරීම් ක්‍රමය පදනම් කරගෙන පාරිතෝෂික වගකීම් ගණනය කර ලාභය හෝ අලාභය මූල්‍ය ප්‍රකාශනවලට ගැලපිය යුතු වුවද, සමාගම ඊට අනුකූලවී නොතිබුණි. | 2025 වර්ෂයේ දී ගිණුම්කරණ ප්‍රමිත 28.18 ට අනුකූලව පාරිතෝෂික මුදල් ගිණුම්ගත කරන බව දන්වා සිටිමි. | ගිණුම්කරණ ප්‍රමිතිය ප්‍රකාරව ආයුගණක අගය කිරීම් ක්‍රමය පදනම් කරගෙන පාරිතෝෂික වගකීම ගණනය කර ගිණුම්ගත කළ යුතුය. |
| (ඉ) | වාණිජ දැව වශයෙන් අලෙවි කිරීමට නිර්දේශ කරමින් රු.9,446,800 කට තක්සේරු කර තිබූ දම්මින්න ගොවිපොළෙහි තේක්ක ගස් 195 ක් හා ගිරාදුරුකෝට්ටේ ගොවිපොළෙහි තේක්ක ගස් 211 ක්, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 41 හි 10 ඡේදය අනුව ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙම තේක්ක ගස් තක්සේරු කිරීම සඳහා රාජ්‍ය දැව සංස්ථාවෙන් ස්ථානීය වටිනාකම ලබා ගැනීමට හැකි වූයේ 2025 පෙබරවාරි මාසයේදීය. එම නිසා එම ගස් තක්සේරු කර 2025 වර්ෂයේ අවශ්‍ය ගිණුම් වලට ඇතුළත් කරන බව දන්වා සිටිමි. | ගිණුම්කරණ ප්‍රමිතිය ප්‍රකාරව මෙම ගස් තක්සේරු කර එම වටිනාකම ගිණුම්ගත කළ යුතුය. |

**1.5.2.2 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වර්ෂයේ ආදායම් වියදම් නිවැරදිව හඳුනාගැනීම වෙනුවට පූර්ව වර්ෂ මූල්‍ය ප්‍රතිඵලයට ගැලපීම් සිදු කිරීම සමාගම විසින් දිගින් දිගටම සිදුකර තිබීම හේතුවෙන් 2021, 2022 හා 2023 වර්ෂවල විගණිත මූල්‍ය ප්‍රකාශනවල පැවති පිළිවෙලින් රු.1,325,555 ක අලාභය, රු.167,815 ක ලාභය හා රු.295,352 ක අලාභය සඳහා පසු වර්ෂයේදී පිළිවෙලින් රු.3,376,919 ක්, රු.2,089,263 ක් හා රු.20,856,669 ක් පූර්ව වර්ෂ ගැලපීම් සිදුකර තිබුණි. මේ හේතුවෙන් 2021,2022 හා 2023 වර්ෂවලදී පිළිවෙලින් රු.1,695,098 ක අලාභයක්, රු.627,268 ක ලාභයක් හා රු.6,346,924 ක අලාභයක් දක්වා මූල්‍ය ප්‍රතිඵලය සියයට 28 සිට සියයට 2048 දක්වා වෙනස් අගයක් ගෙන තිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට සටහන් කර ගනිමි. | වර්ෂයට අදාළ ආදායම් වියදම් නිවැරදිව හඳුනාගැනීම සඳහා වගකීම් සහිත පාලන පද්ධතියක් ස්ථාපිත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාගම සතුව පැවතුණු තඹුත්තේගම පිහිටි නිරාවිය ගොවිපොළ, කන්තලේ ගොවිපොළ, පොළොන්නරුව පිහිටි සිද්ධපුර ගොවිපොළ හා වැලිකන්ද පිහිටි මුතුවැල්ල ගොවිපොළ වර්ෂ 2005-2010 අතර කාලපරිච්ඡේදය තුළ විධිමත් ලිඛිත ලේඛන හුවමාරුවකින් තොරව මහවැලි අධිකාරිය වෙත පවරා දී තිබුණි. එම ගොවිපොළවල් සතු එකතු වටිනාකම රු.22,335,573 ක් වූ ස්ථාවර වත්කම් සමාගම විසින් භාවිතා නොකරන නමුත්, සමාගමේ ගිණුම්වල ඇතුළත් කර තිබුණි. තවද එම වත්කම් ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය හෝ සමාගම විසින් භෞතිකව සමීක්ෂණය කර නොතිබුණි. | මෙම වත්කම් 2025 වර්ෂයේදී සමාගම විසින් භෞතිකව සමීක්ෂණය කරන බව දන්වා සිටිමි. | සමාගමට අයත් වත්කම් පමණක් ගිණුම් තැබීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල වෙත ගෙවිය යුතු රු.652,809 ක් වූ අධිභාර හා සේවක අර්ථසාධක අරමුදල වෙත ගෙවිය යුතු රු.402,513 ක් වූ අධිභාර සමාලෝචිත වර්ෂයේ ගිණුම්ගත කර නොතිබුණි. | 2025 වර්ෂයේ දී අධිභාරය ගිණුම් ගතකරන බව හා හිඟ මුදල් ගෙවා අවසන් කරන බව දන්වා සිටිමි. | සියළු වගකීම් හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඈ) | 2022 වර්ෂයේ සිදුකළ එහෙත් වියදමක් ලෙස එම වර්ෂයේදී ගිණුම්ගත නොකළ රු.441,111 ක් වූ වාහන අළුත්වැඩියා වියදම සමාලෝචිත වර්ෂයේදී ද ඉදිරියට කළ ගෙවීමක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දක්වා තිබුණි. | 2025 වර්ෂයේ ලාභ අලාභ ගිණුමට ඇතුළත් කිරීමට කටයුතු කරමි. | මෙම වියදම 2022 වර්ෂයට අයත් බැවින්, එය පූර්ව වර්ෂ ගැලපීම් ලෙස හඳුනාගෙන ගැලපීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | 2024 දෙසැම්බර් 31 දිනට අපහරණය නොකළ රු.2,285,000 ක වාහන 5ක් හා ට්‍රැක්ටර් ටේලර් 2 ක් ජංගම නොවන වත්කම් ශේෂයන් ඉවත් කර තිබුණි. | මෙම වාහන 2025 වර්ෂයේදී අපහරණය කිරීමට කටයුතු කරමි. | තවමත් සමාගමේ භාවිතයේ පවතින වාහන 5 සහ ට්‍රැක්ටර් ටේලර් 2 ක්, ජංගම නොවන වත්කම් ශේෂයන් ලෙස නැවත ඇතුළත් කළ යුතුය. |
| (ඊ) | දීර්ඝ කාලයක සිට ගිණුම්වල ගෙවිය යුතු ලෙස දක්වා ඇති නොගෙවූ හිඟ වැටුප් රු.3,992,144 ක්, සහ ඊට අදාල අර්ථසාධක දායක අරමුදල් රු.1,144,999 ක් හා සේවක භාරකාර දායක මුදල් රු.166,208 ක් සම්බන්ධයෙන් කම්කරු දෙපාර්තමේන්තුව මඟින් නඩු පවරා තිබුණද ඒ වෙනුවෙන් ප්‍රමාණවත් හෙළිදරව් කිරීම් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | 2025 වර්ෂයේ දී වාරික වශයෙන් ගෙවීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | ගිණුම්කරණ ප්‍රමිතිය ප්‍රකාරව හෙළිදරව් කිරීම් කළ යුතුය. |

### 1.5.2.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| | විෂයය | මුදල රු. | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | පොදු සංචිතය | | | | |
| (i) | මහවැලි ආර්ථික ඒජන්සිය | 388,575,802 | වටිනාකම සනාථ කරගත හැකි සාක්ෂි | මෙම ශේෂ ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ පශු සම්පත් සංවර්ධන අංශය ලෙස පැවති කාලයේදීම අංශයට ලබා දෙන ලද මුදල් වේ. මේ පිළිබඳව සමාගමේ කිසිදු සටහනක් නොමැත. | ශේෂ සනාථ කර ගැනීමට අදාළ ලියවිලි විගණනයට ඉදිරිපත් කළ යුතුය. |
| (ii) | කොත්මලේ කිරි සංවර්ධන අරමුදල | 2,900,000 | -එම- | | |
| (iii) | යුරෝපා ආර්ථික කොමිසමේ ප්‍රාග්ධන ප්‍රදාන | 3,583,706 | ගිණුම්ගත කිරීමට අදාළ ලියකියවිලි | | |
| (iv) | විදේශ ආධාර | 5,729,782 | -එම- | | |
| (ආ) | ප්‍රාග්ධන සංචිත | 14,159,541 | -එම- | | |

### 1.5.3 සීමාසහිත ස්වාභාවික සම්පත් කළමනාකරණ පුද්ගලික සමාගම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාගම ඈවර කරමින් පවතින අතර එම සමාගමේ මූල්‍ය ප්‍රකාශන ඒකාබද්ධ කර නොතිබුණි. | ඈවර කරමින් පවතී. | ඈවර කරමින් පවතින සමාගමේ මූල්‍ය ප්‍රකාශන ඒකාබද්ධ කර ඉදිරිපත් කල යුතුය. |

### 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ II වන ඛණ්ඩයේ 102 වගන්තිය. | අධිකාරිය ආදායම් බදු සඳහා ලියාපදිංචිවී නොතිබුණි. | ඉදිරියේදී බදු පදනම මත ලාභය ගණනය කර ආදායම් බදු ගෙවීමට කටයුතු කරමි. | අධිකාරිය ආදායම් බදු සඳහා ලියාපදිංචි වියයුතුය. |
| (ආ) | 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත- II පරිච්ඡේදය | අධිකාරිය ඉඩම් බදුදීම, ඛනිජ සම්පත් නිස්සාරණය සඳහා ඉඩම් පරිහරණ ගාස්තු අය කිරීම, සංචාරක නිවාස කුලියට දීම වැනි එකතු කළ අගය මත බදු අයකරන ක්‍රියාකාරකම්වල නිරතවී සිටියද දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ | ඉදිරියේදී 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත යටතේ බදු ගෙවීම සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වීමට කටයුතු කරමි. | අධිකාරිය එකතු කළ අගය මත බදු පනත යටතේ ලියාපදිංචි වියයුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | ලියාපදිංචි එකතු කළ අගය මත බදු අයකිරීම සඳහා කටයුතු කර නොතිබුණි. | | |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය. | | | |
| (i) | මු.රෙ. 104 | (i) දෙහිඅත්තකන්ඩිය නේවාසික ව්‍යාපාර කළමනාකරණ කාර්යාලයට අනුයුක්ත කර තිබුණු කැබ් රථයක් 2019 දෙසැම්බර් 22 දින අනතුරට ලක්වී තිබුණි. අලාභහානිය සිදුවූ දිනයේ සිට මාස 03 ක් ඇතුළතදී හානි සම්බන්ධ පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කළයුතු වූවත්, අනතුර සම්බන්ධයෙන් පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කර තිබුණේ අනතුර සිදුවී වර්ෂ 03 කුත් මාස 05 කට පසුවය. වාහනය 2023 මාර්තු 23 දින රු.මිලියන 9.99 ක ඇස්තමේන්තුවක් මත පුද්ගලික ආයතනයක අනුරාධපුර ශාඛාව වෙත අලුත්වැඩියා කටයුතු සඳහා භාරදී තිබුණද, රක්ෂණ වන්දි ලෙස රු.මිලියන 3.7 ක් පමණක් අනුමතවී තිබුණි. 2025 මැයි 20 දින වන විටත් අලුත්වැඩියා කටයුතු නිම කර නොතිබුණු අතර, රක්ෂණ වන්දියෙන් ආවරණය නොවන අලුත්වැඩියා වියදම වන රු.මිලියන 6.29 ක මුදල අදාළ වගකිවයුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම අනතුර සම්බන්ධයෙන් අධිකාරිය වෙත සිදුව ඇති මූල්‍යමය අලාභයෙන් රු.2,724,532.71 ක මුදල අය කර ගැනීමට අදාළව නෛතික ක්‍රියාමාර්ගයන් ගැනීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුව වෙතින් උපදෙස් ලබා ගැනීමට කටයුතු කළ අතර, එහිදී මෙම සිද්ධිය සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 (i) අනුව කටයුතු කිරීම හැර වෙනත් නෛතික ක්‍රියාමාර්ගයන් ගැනීමට නොහැකි බව නියෝජ්‍ය අධ්‍යක්ෂ (නීති) වෙත වාචිකව දන්වා ඇත. මුදල් රෙගුලාසි 104 (i) අනුව කටයුතු කර ඇත.<br><br>එසේම 2025.05.16 වන දින පැවති විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේ දී ගන්නා ලද තීරණවලට අනුව අමාත්‍යාංශයේ නිලධාරීන් තිදෙනෙකුගෙන් සමන්විත කමිටුවක් මඟින් නැවත මේ සම්බන්ධයෙන් පරීක්ෂණයක් මේ වන විට සිදු කරනු ලබයි. | අනතුරට පත් රථය කඩිනමින් අළුත්වැඩියා කිරීමටත්, අධිකාරියට සිදුවූ අලාභය වගකිවයුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමටත් කටයුතු කළයුතුය. |
| | | (ii) වලව විශේෂ බලප්‍රදේශයට අයත් දොඹකර යන්ත්‍රයක් 2014 සැප්තැම්බර් 07 දින | මේ පිළිබඳව කඩිනම් ක්‍රියාමාර්ග ගැනීමට සටහන් කර ගතිමි. | මෙම යන්ත්‍රය අළුත්වැඩියා නොකිරීම |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | මාලිගාවිල පුදබිමේ වහලය ඉදිකිරීම සඳහා යොදවා තිබියදී අනතුරකට ලක්වී තිබුණද, ඒ සම්බන්ධයෙන් පරීක්ෂණ වාර්තාවක් ලබාගෙන නොතිබුණු අතර, අනතුර සිදුවී වසර 11 ක් ගතවී තිබූ නමුත් මෙම වත්කම අළුත්වැඩියා කිරීමට කටයුතු කර නොතිබුණි. | | සම්බන්ධයෙන් වගකිවයුතු නිලධාරීන් හඳුනාගෙන ඒ සඳහා විනය ක්‍රියාමාර්ග ගතයුතු අතර, යන්ත්‍රය තවදුරටත් ප්‍රමාද නොකර අළුත්වැඩියා කර පාවිච්චියට ගත යුතුය. |
| | (ii) | මු.රෙ. 507 | වාර්ෂික ගිණුම්වල ඇතුළත් කිරීම සඳහා එක් එක් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පවතින තොග භෞතිකව සත්‍යාපනය කළයුතු වුවත්, එච්, එල් හා වන පරිසර අංශය හැරුණු කොට ඉතිරි කලාපවල තොග සත්‍යාපනයක් සිදුකර නොතිබුණි. | මේ වන විට අදාළ තොග සත්‍යාපන කටයුතු අවසන් කර වාර්තා ලැබී ඇති බැවින්, හඳුනාගත් තවදුරටත් සිදු කළයුතු ගැලපීම් 2025 වර්ෂය තුළදී ගැලපීමට කටයුතු කරනු ලැබේ. | මුදල් රෙගුලාසිවලට අනුකූලව දෙසැම්බර් මස 31 දිනට සියළුම අංශවල පවතින තොග භෞතිකව සත්‍යාපනය කළයුතුය. |
| (ඇ) | 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන 1992 මුදල් රෙගුලාසි සංග්‍රහයේ විධිවිධාන සංශෝධනය කිරීමේ රාජ්‍ය මුදල් චක්‍රලේඛය. | | | | |
| | (i) | මු.රෙ 371 (2) (ආ) | භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව කන්දකාඩු හා ගිරාඳුරුකෝට්ටේ විදුලිවැට ඉදිකිරීම සඳහා පර්යේෂණ හා විශේෂ ව්‍යාපෘති අධ්‍යක්ෂ වෙත 2021 වර්ෂයේදී ලබා දී තිබූ එකතුව රු.මිලියන 17.24 ක අත්තිකාරම් 2025 මැයි 20 දිනටත් පියවා නොතිබූ අතර, අදාළ කාර්යයන්ද නිසි පරිදි ඉටුකර නොතිබුණි. | මැනුම් පත්‍රය තාක්ෂණ අංශයේ නිලධාරියෙකුගේ සහතිකය මත ඉදිරිපත් නොවීම අත්තිකාරම් පියවීමට ගැටලුවක්වී තිබූ බැවින් මෙම අලි වැටවල් ඉදිකිරීම සම්බන්ධයෙන් අධීක්ෂණ කටයුතු සිදුකළ යාන්ත්‍රික ඉංජිනේරු වෙතින් ඒ සම්බන්ධයෙන් ලිඛිත ඉල්ලීමක් සිදුකළද මේ දක්වා පිළිතුරක් ලැබී නොමැත. ඒ සම්බන්ධයෙන් නැවත සිහිකැඳවීම් ලිපියක් යොමු කර ඇත. | භාණ්ඩාගාර අනුමැතියකින් තොරව අත්තිකාරම් සීමාව ඉක්මවා ගෙවන ලද මුදල සම්බන්ධයෙන් ගෙවීමට අදාළ නිලධාරීන් වගකිව යුතුය. ඒ සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වා එම නිලධාරීන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගතයුතු අතර, රජයට සිදුවී ඇති |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | | පාඩුව අයකර ගැනීමට කටයුතු කළයුතුය. අදාල කාර්යයන්ද නිසි පරිදි ඉටුකරවා ගැනීමට ක්‍රියාමාර්ග ගතයුතුය. |
| | (ii) | මු.රෙ.876(2) (අ) | දැනට ක්‍රියාත්මක අරමුදල් ජාතික අවශ්‍යතාවයක් බව පෙනී යන්නේ නම් හා එම අරමුදල් පනතක් මගින් පාර්ලිමේන්තුවේ අනුමතවී නොමැති නම් එම අරමුදල් සඳහා මෙම චක්‍රලේඛය නිකුත් කර වසරක් ඇතුළත පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබාගත යුතු වූවත්, 1991 වර්ෂයේ ආරම්භ කරන ලද මහවැලි පදනම අරමුදල සඳහා අදාළ අනුමැතිය ලබාගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම අරමුදල ආරම්භ කර ඇත්තේ 1991.02.25 දිනදීය. ඒවායේ මූලාශ්‍ර, තොරතුරු ගොනු තුළ නොමැති බැවින්, මේ සඳහා පාර්ලිමේන්තු අනුමැතිය ලබාගෙන තිබේ දැයි පරීක්ෂා කළ නොහැක. කෙසේ වෙතත් මෙම අරමුදලේ ඇති මුදල් පිළිබඳව නැවත පාර්ලිමේන්තු අනුමැතියක් ලබාගෙන මෙම කටයුතු විධිමත් කිරීමට කටයුතු කරමි. | මහවැලි පදනම අරමුදල සඳහා මුදල් රෙගුලාසි අනුව කඩිනමින් පාර්ලිමේන්තු අනුමැතිය ලබාගැනීමට කටයුතු කළයුතු අතර, මුදල් රෙගුලාසි ප්‍රකාර කටයුතු නොකළ නිලධාරීන් සඳහා විනය ක්‍රියාමාර්ග ගතයුතුය. |
| | (iii) | මු.රෙ.877(2) (ඇ) | ගිණුම් වර්ෂය අවසන්වී මාස 2 ක් ඇතුළත ඒ ඒ අරමුදල පිළිබඳ සහතික කළ මූල්‍ය ප්‍රකාශනද සමඟ කාර්යසාධන වාර්තාවක් රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවට පිටපත් සහිතව විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළයුතු වූවත්, මහවැලි පදනම අරමුදල සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් අදාළ නිලධාරීන් ද දැනුවත් කර 2026 වර්ෂයේ සිට මෙම අවශ්‍යතා සම්පූර්ණ කිරීමට කටයුතු කරමි. | මුදල් රෙගුලාසි ප්‍රකාර අරමුදලට අදාළ මූල්‍ය ප්‍රකාශන හා කාර්යසාධන වාර්තා අදාළ පාර්ශව වෙත ලබාදීමට කටයුතු කළයුතුය. |
| (ඉ) | 2021 නොවැම්බර් 16 දිනැති අංක PED-01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මගින් ස්ථාපනය කරන ලද මෙහෙයුම් අත්පොතේ | | | | |
| | (i) | 3.5 ඡේදය | අමාත්‍ය මණ්ඩල අනුමැතියකින් තොරව බාහිර ආයතන වෙත 2020 වර්ෂයේ සිට 2024 දෙසැම්බර් 31 දින දක්වා වූ කාලසීමාවේදී මහවැලි ආරක්ෂක බලකායේ 31 | 2020 වර්ෂයේ සිට 2023 දෙසැම්බර් 31 දක්වා වූ කාල සීමාවේ බාහිර ආයතන සඳහා මුදා හැර සිටි මහවැලි ආරක්ෂක බලකායේ සියළුම නිලයන්ට එම කාල සීමාව තුළ | අමාත්‍ය මණ්ඩල අනුමැතිය රහිතව අනෙකුත් ආයතන වෙත මුදාහල සේවකයන්ට ගෙවූ පාරිශ්‍රමික |

| | | | | |
|---|---|---|---|---|
| | | දෙනෙකු මුදාහැර තිබුණි. ඊට අමතරව ඔවුන්ට වැටුප් සේවක අර්ථසාධක අරමුදල් හා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල සඳහා දායකත්ව මුදල් සහ අතිකාල හා ගමන් වියදම් දීමනා ලෙස පිළිවෙලින් රු.මිලියන 21.17 ක්, රු.මිලියන 5.35 ක් හා රු.473,817 ක් ගෙවා තිබුණද, එම මුදල් ආපසු අධිකාරිය වෙත ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ගෙවන ලද වැටුප් ප්‍රතිපූරණය කර ගැනීමට අදාළ ආයතන වෙත වරින් වර ලිපි යොමු කර ඇත. | ආපසු අයකර ගතයුතු අතර, අනුමැතියකින් තොරව කළ මෙම මුදාහැරීම් සඳහා අදාළ නිලධාරීන් වගකිව යුතුය. |
| (ii) | 7.2 ඡේදය | අධිකාරියේ කාර්යසාධනය ඇගයීම පිණිස මූලික කාර්යසාධන දර්ශක හා මෙහෙයුම් කාර්යසාධන දර්ශක පිහිටුවා ඒ සඳහා භාණ්ඩාගාරයේ එකඟතාවය ලබාගතයුතු වුවද එසේ කර නොතිබුණි. | ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ කාර්යසාධන ඇගයීම පිණිස මූලික කාර්යසාධන දර්ශක හා මෙහෙයුම් කාර්යසාධන දර්ශක ඇතුළත් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ මුද්‍රිත පිටපත අමාත්‍යාංශ ලේකම් වෙත ඉදිරිපත් කර ඇත. භාණ්ඩාගාරයේ අනුමැතිය සඳහා අදාළ ලේඛන ඉදිරිපත් කිරීම අමාත්‍යාංශ ලේකම් කාර්යාල මට්ටමෙන් සිදු කරනු ලබයි. | අමාත්‍යාංශයෙන් විමසා ඒ සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබාගැනීමට කටයුතු කළයුතුය. |
| (ඊ) | 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මඟින් හඳුන්වා දුන් රාජ්‍ය ව්‍යවසායයන් සඳහා වන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.3 ඡේදය | උපාය මාර්ගික සැලැස්ම, ක්‍රියාකාරී සැලැස්ම හා වාර්ෂික අයවැය ලේඛනය සමඟ රේඛීය අමාත්‍යාංශයේ ලේකම් හරහා අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර නොතිබුණි. | 2024 සැප්තැම්බර් 13 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සඳහා 2024 දෙවන සංශෝධිත ක්‍රියාකාරී සැලැස්මේ මුද්‍රිත පිටපත ඉදිරිපත් කර ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන ඇත. | වාර්ෂික උපාය මාර්ගික සැලැස්ම, ක්‍රියාකාරී සැලැස්ම හා අයවැය ලේඛනය රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීමට කටයුතු කළයුතුය. |

## 1.8 මුදල් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අධිකාරිය ප්‍රාදේශීය සංවර්ධන බැංකුව හරහා ඒකාබද්ධව මහවැලි කලාපවල ව්‍යවසායකයින් සඳහා අවශ්‍ය මූලික පහසුකම් සලසා දෙමින් කෘෂිකාර්මික, සත්ත්ව පාලන, අගය එකතු කළ හා වෙනත් කර්මාන්ත ආශ්‍රිත නිෂ්පාදන දේශීය විදේශීය වෙළෙඳ පොළට එක් කිරීම තුළින් මහවැලි ජනපදිකයින්ගේ ජීවන තත්ත්වය උසස් කිරීම අරමුණු කරගෙන ක්‍රියාත්මක කර තිබූ සුළු හා මධ්‍ය පරිමාණ ණය | "මහවැලි සවිය" ණය යෝජනා ක්‍රමය යටතේ එළඹ ඇති ගිවිසුම පරිදි ප්‍රාදේශීය සංවර්ධන බැංකුව විසින් නිකුත් කරන ණය මුදල් සඳහා සියයට 08 ක පොලියක් අය කළද එය බැංකුව සිය වියදම් පියවීම සඳහා සම්පූර්ණ වශයෙන්ම භාවිතා කරයි. ආයෝජකයින් වෙත නිකුත් නොකළ මුදල් ප්‍රමාණය සඳහා වාර්ෂික | නිකුත් කරන ණය සඳහා අය කරන පොලියෙන් කොටසක් අධිකාරියට ලැබෙන සේ අදාළ ගිවිසුම් සංශෝධනය කර |

| | | |
|---|---|---|
| | යෝජනා ක්‍රම 3 න් මහවැලි සවිය හා මහවැලි සුරකුම් ණය යෝජනා ක්‍රම යටතේ ණය දීම සඳහා 2006, 2010, 2017 වර්ෂවල ලබාදුන් රු.මිලියන 151.94 ක මුදලින් 2024 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.මිලියන 131.1 ක් ණය ලෙස ලබාදී තිබුණි. මෙම මහවැලි සවිය හා මහවැලි සුරැකුම් ණය යෝජනා ක්‍රමය යටතේ ණය ලෙස ලබා දුන් මෙම මුදල සඳහා බැංකුව අයකර ගන්නා පොළියෙන් කිසිදු මුදලක් අධිකාරිය වෙත ලබා දී නොතිබුණි | සාමාන්‍ය ඉතිරි කිරීම් පොලී අනුපාතය යටතේ පොලී ආදායම් හිමි වේ. එම පොලී ආදායම මූලික ප්‍රාග්ධනයට එකතුකර ආයෝජකයින් වෙත ණය මුදල් නිකුත් කිරීම සඳහා යොදා ගැනේ.<br><br>”මහවැලි සුරැකුම්” ණය යෝජනා ක්‍රමය යටතේ එවකට ලංකා පුත්‍ර සංවර්ධන බැංකුවේ තැන්පත් කර ඇති රු.මිලියන 76 ක වර්තමාන අරමුදල මඟින් ණය නිකුත් කිරීම් ආරම්භ කර ඇති අතර එම ණය යෝජනා ක්‍රමය යටතේ ද නිකුත් කරන ණය මුදල් සඳහා ලැබෙන පොලී ආදායම සියයට 4 සහ නිකුත් නොකල ණය මුදල් සඳහා සාමාන්‍ය ඉතිරි කිරීම් පොලී අනුපාතය යටතේ ලැබෙන පොලී ආදායම් අධිකාරියේ ආදයම් ලෙස නොලැබුණ ද චක්‍රීය අරමුදලට එකතු කර ණය නිකුත් කිරීම සඳහා භාවිතා කරනු ලැබේ. | ගැනීමට කටයුතු කළයුතුය. |

**02. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵලය**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 9,884,296 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 6,201,724 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 3,682,572 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට රජයේ පුනරාවර්තන ප්‍රතිපාදන ලැබීම් රු. 2,072,178 සිට (රු. 257,474) දක්වා සියයට 112 කින් අඩුවීම හා ප්‍රාග්ධන වියදම් රු. 851,986 සිට රු.3,023,771 දක්වා සියයට 255 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

**03. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 අනාර්ථික ගනුදෙනු**

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මහවැලි බී කලාපයට අයත් කන්දකාඩු ප්‍රදේශයේ අක්කර 3770 ක භූමි ප්‍රදේශයක කෘෂිකර්ම හා පශු සම්පත් සංවර්ධන ව්‍යාපෘතියක් සඳහා පාරිසරික බලපෑම් ඇගයීමේ වාර්තා සකස් කිරීමේ කොන්ත්‍රාත්තුව ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයට රු.මිලියන 6.54 කට 2021 සැප්තැම්බර් 28 දින ප්‍රදානය කර එයින් රු.මිලියන 3.21 ක් ගෙවා තිබුණි. අමාත්‍ය මණ්ඩල තීරණයකට අනුව මෙම ඉඩමේ හිමිකම ජාතික පශු සම්පත් මණ්ඩලය වෙත පැවරීම හේතුවෙන් කොටසක් පමණක් නිමකර තිබූ මෙම පාරිසරික බලපෑම් ඇගයීම් වාර්තාව පැවරිය යුත්තේ කුමන ආයතනය | මේ සම්බන්ධයෙන් 2025.05.16 පැවති අමාත්‍යාංශ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේදී දෙන ලද උපදෙස් පරිදි ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, වාරිමාර්ග අමාත්‍යාංශය (නීති අංශය) හා ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය සමග සාකච්ඡා සිදු කරන ලද අතර එහිදී එළඹි තීරණ පහත පරිදි වේ.<br>**i.** යෝජිත කාන්දකාඩුව ව්‍යාපෘතිය සඳහා EIA වාර්තාව සකස් කිරීමට අදාල හිග මුදල NLDB ආයතනය මගින් ගෙවීම් කල නොහැක.<br>**ii.** ඒ සඳහා මහවැලි අධිකාරියේ තාක්ෂණික කමිටුවක් පත්කර ඒ | අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා කරුණු ඉදිරිපත් කිරීමේදී පැවරීමට යෝජිත භූමි ප්‍රදේශයට අදාලව ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය සමඟ පාරිසරික බලපෑම් ඇගයීම් වාර්තාවක් සකස් කිරීම පිළිබඳ කොන්ත්‍රාත්තුවක ට එළඹ ඇති බව |

| | | | |
|---|---|---|---|
| | වෙතද හා මීට අදාළ ඉදිරි ගෙවීම් කුමන ආයතනයකින් දැරිය යුතුද යන්න පිළිබඳ නිශ්චිත එකඟතාවයකට එළඹීමට අපොහොසත්වීම මත අදාළ පාරිසරික ඇගයීම් වාර්තාව අවසන් කර නොතිබුණි. නිසි සැලසුමකින් තොරව මෙසේ වැය කරන ලද රු.මිලියන 3.21 ක මුදල වර්තමානය වනවිට නිෂ්කාර්ය වියදමක් බවට පත්වී තිබුණි. | හරහා EIA වාර්තා අධ්‍යයනය කර ඉදිරි ගෙවීම් සිදු කිරීමට නිර්දේශ ලබා ගැනීම හා ඒ අනුව ගෙවීම් සිදු කිරීම.<br>iii. හිග මුදල් ගෙවීම් කර ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය සමග ඇති ගිවිසුම අවලංගු කිරීම. | හා ඒ සඳහා තවදුරටත් ගෙවිය යුතු මුදල් පිළිබඳ සඳහන් නොකිරීම සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වා ඊට වගකිවයුතු පුද්ගලයන්ගෙන් නිෂ්කාර්ය වියදම පියවා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | අධිකාරිය විසින් කිරිගව පාලනයේ නියුතු ගොවීන්ට මහවැලි බී, සී, ඩී, එල් සහ උඩවලව කලාපවල තෘණ වගාව සඳහා අක්කර 2,802 ක් ලබාදී සත්ත්ව පෝෂණය වැඩිදියුණු කිරීමට අදාළ ක්‍රියාකාරකම්වලින් යුක්ත වැඩසටහනක් ආරම්භ කර 2020 දෙසැම්බර් 31 දින වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණද, කිසිදු ඉඩමක් තෘණ වගාකරුවන් වෙත බෙදාදී නොතිබුණි. තවද එල් කලාපයේ වෙහෙරතැන්න තෘණ භූමියේ පාරිසරික පරීක්ෂණ, පුරාවිද්‍යා ඇගයීම් පරීක්ෂණ හා මැනුම් කටයුතු සඳහා රු.මිලියන 6.57 ක් වැය කර තිබුණි. | හිටපු ජනාධිපති ලේකම්ගේ උපදෙස් පරිදි ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට ඉඩම් බැහැර කිරීම තාවකාලිකව අත්හිටුවන ලදි. එහෙත් වර්තමාන ජනාධිපති ලේකම්ගේ 2025.01.09 දිනැති ලිපිය අනුව ගරු විෂය භාර අමාත්‍යවරයාගේ නිර්දේශය මත මහවැලි අධිකාරියේ පරිපාලනය යටතේ ඇති රජයේ ඉඩම් බැහැර කිරීම සඳහා අවසර ලබා දී ඇත. | තෘණ වගාකරුවන් සඳහා ඉඩම් බැහැර කිරීම තවදුරටත් ප්‍රමාද නොකර අපේක්ෂිත ප්‍රතිලාභ ලඟාකර ගතයුතුය. |
| (ඇ) | මහවැලි බී කලාපයේ කෘෂිකර්ම සංවර්ධන වැඩසටහන යටතේ කෘෂි බෝග නිෂ්පාදන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා අක්කර 540 ක පමණ භූමි ප්‍රමාණයක් මුතුවැල්ල වැලිකන්ද ප්‍රදේශයෙන් ලබා දීමට 2020 වර්ෂයේ සැලසුම් කර තිබුණි. මෙම ආයෝජන ව්‍යාපෘතිවල පාරිසරික බලපෑම් ඇගයීම සඳහා කොළඹ විශ්ව විද්‍යාලය වෙත රු.මිලියන 2.62 ක් 2021 හා 2022 වර්ෂවලදී ගෙවා තිබුණද, සැලසුම් කළ වර්ෂයේ සිට වර්ෂ 05 කට අධික කාලයක් ගතවී තිබුණද, කිසිදු ආයෝජන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කර නොතිබුණි. | මෙම ව්‍යාපෘතිය සඳහා පරිසර අනුමැතිය 2025.04.04 දින අප වෙත ලැබී ඇත. මේ වන විට මෙම ව්‍යාපෘතිය පරිසර අනුමැතියේ කොන්දේසි ප්‍රකාරව ක්‍රියාත්මක කිරීම සම්බන්ධව අදාල අධ්‍යක්ෂකවරුන් සමඟ සාකච්ඡා පවත්වා ඇති අතර මෙම සාකච්ඡාවේ ගත් තීන්දු තීරණ සම්බන්ධව සියලු අංශ දැනුවත් කර ඇත. | කඩිනමින් අපේක්ෂිත ප්‍රතිලාභ ලඟාකර ගැනීම සඳහා ආයෝජන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළයුතුය. |
| (ඈ) | මහවැලි අධිකාරියේ බලප්‍රදේශයේ ජලාශවලට අවශ්‍ය මත්ස්‍ය ඇඟිල්ලන් මහවැලි කලාප ආශ්‍රිතව නිෂ්පාදනය කරගැනීමට වැඩසටහනක් 2021 වර්ෂය තුළ ආරම්භ කර තිබුණි. ඒ අනුව සී, එච්, හුරුළුවැව සහ වලව යන කලාපවල පොකුණු පද්ධති ඉදිකිරීමට සැලසුම් කර තිබූ නමුත්, 2025 මැයි 20 වනවිට එච් කලාපයේ පමණක් | මහවැලි සී කලාපයේ ජලාශ සඳහා මත්ස්‍ය ඇඟිල්ලන් නිෂ්පාදනය කිරීමට මහවැලි අධිකාරියට අයත් රත්කිඳ ගොවිපල තුළ පොකුණු පද්ධතියක් ඉදි කිරීම 2021 වසරේ ආරම්භ කරන ලදි.<br><br>නමුත් ගරු වාරිමාර්ග අමාත්‍යතුමා විසින් 2022.11.16 දින ඉදිරිපත් කරන | ලබාදී ඇති අමාත්‍ය මණ්ඩල අනුමැතියට අනුව කටයුතු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම තවදුරටත් ප්‍රමාදයකින් තොරව සිදුකර |

| | | |
|---|---|---|
| පොකුණු ඉදිකිරීමේ කටයුතු අවසන් කර තිබුණි. අනෙකුත් කලාප සඳහා රු.මිලියන 2.04 ක් වැයකර තිබුණද, පොකුණු ඉදිකිරීමේ කටයුතු සැලසුම් කළ පරිදි නිමකර නොතිබුණු බැවින් එම මුදල නිෂ්කාර්ය වියදමක් බවට පත්වී තිබුණි. | ලද අමාත්‍ය මණ්ඩල සංදේශයට අනුව මහවැලි ගොවිපල රාජ්‍ය - පෞද්ගලික හවුල්කාරිත්ව ක්‍රමවේදයකට අනුකූලව පුද්ගලික ආයෝජකයින් සම්බන්ධ කරගෙන පවත්වා ගෙන යාම සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා දී තිබීම නිසා තවදුරටත් මහවැලි ගොවිපල වල සංවර්ධන කටයුතු සඳහා මුදල් ප්‍රතිපාදන වෙන් කිරීම නවතා දමන ලදි. ඒ අනුව මත්ස්‍ය පොකුණු ඉදි කිරීම් කටයුතු අත්හිටුවීමට කටයුතු කරන ලදි. | වැය කළ මුදලින් ප්‍රතිලාභ ලබාගැනීමට කටයුතු කළයුතුය. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මහවැලි කලාප 10 ආශ්‍රිතව "උරුමය වැඩසටහන" 2024 වර්ෂයේ ආරම්භ කර, පළමු හා දෙවන අදියර තුළ මහවැලි ජනපදිකයින් 204002 කට ඉඩම් ආඥා පනතේ 02 වගන්තිය යටතේ ඔප්පු බෙදාදීමට ඉලක්ක කර තිබුණි. මෙහිදී ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ මහවැලි ජනපදිකයින් සතුව පැවති ප්‍රදාන පත්‍ර හා අවසර පත්‍ර 69774 ක් ඉඩමෙහි පරම අයිතිය ලබාදීමේ අරමුණින් අධිකාරිය වෙත මෙහිදී ආපසු භාරගෙන තිබුණි. 2024 දෙසැම්බර් 31 දින වනවිට ඔප්පු 26669 ක් පමණක් ලියාපදිංචි කර නැවත ජනපදිකයින් වෙත බෙදාදී තිබුණි. එය සම්පූර්ණ ඉලක්කයෙන් සියයට 13.2 ක් වූ අතර 2024 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 38.8 ක් මෙම වැඩසටහන සඳහා අධිකාරිය වැයකර තිබුණි.<br><br>එසේ වුවද, ඉඩම් සංවර්ධන ආඥා පනතේ මූලික අරමුණ වූයේ කෘෂිකාර්මික සහ නේවාසික කටයුතු සඳහා රාජ්‍ය භූමිය බෙදාදීම, භාවිතය සහ කළමනාකරණය කිරීමයි. මෙමඟින් ඉඩමක් නොමැති පුද්ගලයන් හට නේවාසික සහ කෘෂිකාර්මික කටයුතු සඳහා ඉඩම් ලබාදීමත්, එමඟින් ඵලදායී ලෙස කෘෂිකාර්මික කටයුතු සඳහා රාජ්‍ය භූමිය භාවිතා කිරීම මඟින් ආහාර සුරක්ෂිතතාවය ඇති කරමින් ග්‍රාමීය ජනතාවගේ ජීවන තත්ත්වය නඟා සිටුවීමත්, අඩු ආදායම්ලාභී ජනතාවට ප්‍රමුඛතාවය දීම මඟින් තමන් වෙත සාධාරණය ඉටුකිරීමත්, කෘෂිකාර්මික භූමිය කුඩා කැබලිවලට බෙදීයාම වැළැක්වීම හා කෘෂිකාර්මික ඉඩම් | මහවැලි ජානපදිකයන් 204002 කට සින්නක්කර ඔප්පු ලබා දීම ඉලක්ක කර තිබුණද ඉඩම් ලාභීන් විසින් සින්නක්කර ඔප්පු ලබා ගැනීම සඳහා ප්‍රදානපත්‍ර සහ අවසරපත්‍ර 69744 ක් පමණ අධිකාරිය වෙත භාර දී තිබුණි. ඉන් රේඛා චිත්‍ර ලබා ගැනීමට 55823ක් මිනින්දෝරු දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. එසේ යොමු කර තිබූ 43869ක් සඳහා රේඛා චිත්‍ර ලැබී තිබුණි. ලැබුණු රේඛා චිත්‍ර සඳහා සින්නක්කර ඔප්පු 26669ක් පමණ ලියාපදිංචි කර නැවත ජානපදිකයන් වෙත ලබා දී ඇත. ඉතිරි ප්‍රමාණය අඩුවීමට ප්‍රදානපත්‍ර නැවත භාර දීමේ ප්‍රමාදය, ප්‍රදානපත්‍ර උකසට තබා ණය මුදලක් ලබා ගැනීම, ජීවන භුක්තිය පැවරීමේ කටයුතු ප්‍රමාදය, අනුප්‍රාප්තිකයෙකු පිළිබඳ ගැටලු හේතුවී ඇත. | උරුමය වැඩසටහන මඟින් ඉඩම් සංවර්ධන ආඥා පනත උල්ලංඝනයවී තිබේද යන්න පිළිබඳ පරීක්ෂණයක් පවත්වා ඉඩම් සංවර්ධන ආඥා පනතේ අරමුණු අපේක්ෂා කළ අයුරින් ඉටුකර ගැනීමට සුදුසු යාන්ත්‍රණයක් හඳුන්වා දියයුතුය. |

| | | |
|---|---|---|
| කොටස් ආර්ථිකමය ඒකකයන් වශයෙන් පවත්වාගෙන යාම, භූමිය විකුණා දැමීම, කුලියට දීම හෝ ණය සඳහා ආවරණය කිරීම වැනි ගනුදෙනු සීමා කිරීමත්, එමඟින් භූමි භාවිතය පිළිබඳව රාජ්‍ය පාලනය පවත්වාගෙන යාමත් තහවුරු කර තිබුණි. කෙසේ වෙතත් මෙම නව "උරුමය වැඩසටහන" යටතේ පරම අයිතිය ජනතාවට ලබාදීම තුළින් ඉහත අරමුණු කිසිවක් ඉටු කරගත නොහැකි වන බවට විගණනයේදී නිරීක්ෂණය කරනු ලැබේ. | | |
| (ආ) තඹුත්තේගම කොට්ඨාශයේ 406/408 ඒකකයේ අ.ග.පි 80 හි කැබලි අංක 366 රජයේ රක්ෂිතයක් ලෙස වෙන් කර තිබුණද, අධිකාරිය විසින් මෙම ඉඩම් කොටසින් තඹුත්තේගම ආර්ථික මධ්‍යස්ථානයේ කසල කළමනාකරණය වෙනුවෙන් අක්කර 5 ක් ද, ආරණ්‍ය සේනාසනයක් සඳහා අක්කර 20 ක ප්‍රමාණයක්ද, පේර වගාවක් සඳහා අක්කර 10 ක ප්‍රමාණයක් සහ මිදි වගාවක් සඳහා අක්කර 12 ක ප්‍රමාණයක්ද ලබාදී තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ. | | |
| (i) 2005 වර්ෂයේදී මිදි වගාව සඳහා ලබාදුන් අක්කර 12 ක ප්‍රමාණය එම කටයුත්තට යොදවා නොතිබුණු අතර, නිසි පරිදි බදු මුදල් නොගෙවීම නිසා 2022 වර්ෂයේදී බදුකරුගේ බදු අයිතිය අවලංගු කර තිබුණද, එකඟ වූ පරිදි ඉඩම ආපසු අධිකාරිය වෙත ලබාදී නොතිබුණි. 2024 දෙසැම්බර් 31 දින වනවිට එම ඉඩම සඳහා අයවිය යුතු හිඟ බදු මුදල රු.489,625 ක් විය. | නඩු පවරා ඇත. නියෝග ලබා දීමට නියමිතයි. | හිඟ බදු මුදල් කඩිනමින් අයකර ගැනීමටත්, අනවසරකරුවන් ඉවත් කර ඉඩම රක්ෂිතයක් ලෙස පවත්වාගෙන යාමටත් කටයුතු කළයුතුය. |
| (ii) පේර වගාව සඳහා ලබාදුන් අක්කර 10 ක පමණ භූමි ප්‍රමාණය බදුකරු විසින් වගා නොකර පසුව පුද්ගලික සමාගමක් වෙත රු.මිලියන 3 කට අනීතිකව විකුණා තිබුණි. එම අක්කර 10 ට අමතරව තවත් යාබදව පවතින අක්කර 8 ක පමණ ප්‍රමාණයක් එම සමාගම සිය වගා කටයුතු සඳහා යොදා ගෙන තිබුණි. | සන්තකය ආපසු ලබාගැනීම යන පනත යටතේ නඩු පැවරීමට කටයුතු කරමින් පවතී. | - එම - |
| (iii) මෙම රක්ෂිතයේ නැගෙනහිර මායිමේ අක්කර දෙක/තුනක ප්‍රමාණයක් යම් පුද්ගලයෙකු විසින් | මෙම රක්ෂිතයේ එක් පුද්ගලයෙක් විසින් පමණක් නොව පුද්ගලයින් කිහිපදෙනෙකු විසින් දීර්ඝ කාලයක | අනවසරකරුවන් ඉවත් කර ඉඩම රජයේ රක්ෂිතයක් |

| | | | |
|---|---|---|---|
| | අනවසරයෙන් භුක්ති විඳින අතර, එහි අඹ පොල් වැනි දීර්ඝකාලීන වගාවන් සිදුකර තිබුණි. තඹුත්තේගම කොට්ඨාශ කළමනාකරු විසින් මේ සම්බන්ධයෙන් නේවාසික ව්‍යාපාර කළමනාකරු දැනුවත් කර තිබූ නමුත්, එම අනවසර වගාකරු ඉවත් කිරීමට අවශ්‍ය කටයුතු කර නොතිබුණි. | සිට වගා කටයුතු සිදුකරන අතර මේ පිළිබඳව ක්ෂේත්‍ර පරීක්ෂාවක් සිදු කර නිර්දේශ ලබාගෙන ඉදිරි කටයුතු කිරීමට සටහන් කරගන්නා ලදි. | ලෙස පවත්වාගෙන යාමට කටයුතු කළයුතුය. |
| (iv) | රක්ෂිතයෙන් අක්කර 20 ක භූමි ප්‍රමාණයක් 2021 වර්ෂයේදී ආරණ්‍ය සේනාසනයකට ලබාදී තිබුණද, තඹුත්තේගම නේවාසික ව්‍යාපාර කළමනාකරු විසින් එම අක්කර 20 ක භූමි ප්‍රමාණයට පරිබාහිරව කුටි රාශියක් තැනින් තැන ඉදිකර ඇති බවත් එම මුළු ප්‍රමාණය මැනුම් කිරීමේදී අක්කර 87 ක ප්‍රමාණයක් ඇති බවත්, ඊට පරිබාහිරව තවදුරටත් කුටි ඉදිකරමින් පවතින බවත් දැනුම්දී තිබුණද ඒ සඳහා අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි. | අධ්‍යක්ෂ (ඉඩම් පරිහරණ හා සැලසුම්) විසින් අනුමැතිය ලබා දී ඇති අක්කර 20 ක ප්‍රමාණය නීත්‍යානුකූලව ලබාදීම සඳහා අවශ්‍ය ලේඛන ඉදිරිපත් කරන ලෙස ආරණ්‍ය සේනාසනය වෙත දන්වා ඇත. | අධිකාරිය සතු සංවේදී කලාප හා ප්‍රදේශ ආරක්ෂා කරගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගතයුතුය. |
| (ඇ) | රජවැල්ල ජනාවාසයේ පුද්ගලික සමාගමක් වෙත මු.පි.මහ. 4971 පිඹුරේ අංක 03 හා 05 දරන කැබලි බැහැර කර තිබුණද, 2009 වර්ෂයේ සිට වෙනත් සමාගමක් අවිධිමත්ව එම ඉඩමෙහි ක්‍රියාත්මක වෙමින් පැවතුණි. වාණිජ ඉඩම් කොටස් අවිධිමත් ලෙස අන්සතු කිරීම හා බදු මුදල් නොගෙවීම මත තේරීම්ලාභීත්වය අවලංගු කිරීමට 2019 නොවැම්බර් 06 දින අධ්‍යක්ෂ ජනරාල් අනුමත කර තිබුණද මෙම ඉඩම අවිධිමත්ව අන්සතු කර වසර 14 කට අධික කාලයක් ගතවී ඇතත්, ඒ සම්බන්ධයෙන් ක්‍රියාකර නිසි පරිදි බදු අයකර ගැනීමට අපොහොසත්ව තිබුණි. | ඉඩම් බැහැර කිරීම තාවකාලිකව අත්හිටුවීමට කටයුතු කිරීමත් සමග වර්තමාන භුක්තිකරු නමින් ඉඩම බදු අයිතිය විධිමත් කිරීම සඳහා පරීක්ෂණයක් පැවැත්වීමට අනුමැතිය නොලැබුණි. නමුත් නැවත මහවැලි ඉඩම් බැහැර කිරීමට ජනාධිපති ලේකම්ගේ අනුමැතිය ලිපිය ලැබී ඇති බැවින් මේ සම්බන්ධව ඉදිරි කටයුතු කරගෙන යයි. | චක්‍රලේඛ ප්‍රකාරව ඉඩම් ලබාදීම සිදු කළයුතුය. |
| (ඈ) | වැනිලා, ගම්මිරිස්, කුරුඳු හා ඉඟුරු ආශ්‍රිත නිෂ්පාදන සැකසුම් මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම සඳහා කොත්මලේ කඩදොර ජනාවාසයේ හෙක්ටයාර 0.226 කින් යුත් ඉඩමක් පුද්ගලික සමාගමක් වෙත 2021 ජනවාරි 05 දින භුක්තිය සඳහා භාරදී තිබුණි. භූමියෙන් සියයට 75 කට ආසන්න ප්‍රමාණයක් සංවර්ධනය කර තිබූ අතර, 2025 මැයි 20 වන විට ඉඩම බැහැර කර වසර 04 කට වැඩි කාලයක් ගතවී තිබුණද, දළ තක්සේරුව මත හෝ බදු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | 2023.06.03 දින නේවාසික ව්‍යාපාර කළමනාකාර (ඊ) කලාපය සහ අදාළ විෂයගත නිලධාරීන් සමඟ ක්ෂේත්‍ර පරීක්ෂාවක් සිදුකර ඇති අතර, මෙම ඉඩම ආයෝජකයා විසින් කිසිදු සංවර්ධනයක් කර නොමැතිව අතහැර දමා ඇති බව නිරීක්ෂණය විය. ඒ අනුව මෙය අවලංගු කර ඵලදායී ව්‍යාපෘතියකට ලබාදීමට කටයුතු කරමි. | කඩිනමින් බදු ගිවිසුම්වලට එළඹීමට හෝ භුක්තිය භාර ගැනීමට හා හිඟ බදු අයකර ගැනීමට කටයුතු කළයුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | දිගන නේවාසික ව්‍යාපාර කළමනාකරණ කාර්යාලය යටතේ ආයෝජන ව්‍යාපෘතියක් ලෙස බැහැර කර ඇති දොරගල තේ කර්මාන්තශාලාව හා ඉඩම 1992 වර්ෂයේ සිට පුද්ගලික සමාගමක් වෙත බදු පදනම යටතේ ලබාදී තිබුණි. මෙම දේපල දීර්ඝකාලීන බදු පදනම යටතේ බදුදීමට 2012 වර්ෂයේ අනුමැතිය ලබාදී තිබුණද, බදු ගිවිසුමකට එළඹුණු බවට සාක්ෂි ලිපිගොනුවේ නොතිබුණි. 2024 දෙසැම්බර් 31 දිනට මෙම දේපල සඳහා රු.808,469 ක බදු හිඟයක් පැවතියද, 2024 දෙසැම්බර් 18 දින විගණනය විසින් සිදුකරන ලද වාරක පරීක්ෂාවේදී අදාළ කර්මාන්තශාලාව යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ සමඟ වසා දමා තිබුණි. | කඩිනමින් බදු මුදල් ගෙවන ලෙස බදුකරු දැනුවත් කර ඇත. එහෙත් මේ දක්වා බදු මුදල් ගෙවා නොමැති අතර නීති මගින් කටයුතු කර බදු අයකර ගැනීමටත්, තවදුරටත් ව්‍යාපාරය ආරම්භ නොකළහොත් ඌන උපයෝජන ව්‍යාපෘතියක් සේ සලකා බදු අයිතිය අවලංගු කිරීමටත් ඉදිරියේදී කටයුතු කරමි. | කඩිනමින් හිඟ බදු අයකර ගැනීමට කටයුතු කිරීමටත්, පසුව බදු අයිති අවලංගු කර නව ආයෝජකයෙකු වෙත බැහැර කිරීමටත්, කටයුතු කළයුතුය. |
| (ඊ) | කොත්මලේ ඌණගල්ඔය වතු බංගලාව පරිසර හිතකාමී නිවාඩු නිකේතනයක් ලෙස පවත්වා ගෙන යාමට 2017 අගෝස්තු 16 දින සිට පුද්ගලයෙකුට බැහැර කර තිබුණි. නැවත මෙම දේපල 2023 අගෝස්තු මාසයේ අළුත්වැඩියා කර පවත්වාගෙන යාම සඳහා පුද්ගලික සමාගමකට පවරා දී තිබූ අතර 2024 දෙසැම්බර් මස 18 දින විගණනය විසින් සිදුකළ වාරක පරීක්ෂාවේදී බංගලාවේ ගේට්ටුව වසා අඟුලු ලා තිබුණි. අළුත්වැඩියා කටයුත්තක් සිදුකර ඇති බව බාහිරින් නිරීක්ෂණය නොවීය. | අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියෙන් 2017 අගෝස්තු 16 දින සිට වසර 30 ක් සඳහා ඌණුගල්ඔය වතු බංගලාව (හෙක්.0.739) දීර්ඝකාලීන බදු පදනම මත බැහැර කර ඇත. බදුකරුගේ ඉල්ලීම මත 2023-06-23 දිනැති අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතියට අනුව මෙම දේපොල 2023-08-13 දින පුද්ගලික සමාගමකට පවරා ඇති අතර වර්තමානයේ මෙම වතු බංගලාවේ නඩත්තු කටයුතු සිදුකරමින් පවතී. | ගිවිසුම් ගතවූ පරිදි පුද්ගලික සමාගම කටයුතු නොකරන්නේ නම් දේපල ආපසු ලබා ගතයුතු අතර, මෙම වතු බංගලාව නවීකරණය කර පරිසර හිතකාමී නිවාඩු නිකේතනයක් ලෙස පවත්වා ගෙන යාමට ක්‍රියාමාර්ග ගතයුතුය. |
| (උ) | කොත්මලේ ව්‍යාපෘතිය සඳහා ජනාවාස ඇති කිරීමේ අරමුණ ඇතිව කොටගල පිහිටි හැරින්ටන් වතුයායේ වාරින් ක්‍රොස් ඉඩමෙන් අක්කර 48.35 ක ඉඩමක් රු.මිලියන 4.76 ක් ගෙවා 1985 අගෝස්තු 20 දින අධිකාරිය විසින් අත්පත් කර ගෙන තිබුණි. නමුත් අරමුණෙන් බැහැරව 1994 පෙබරවාරි 04 දින මෙම ඉඩම් කොටසෙන් අක්කර 25.47 ක් ලංකා වතු කම්කරු කොංග්‍රස් කාර්මික ආයතනය වෙත ලබාදී තිබුණි. කෙසේ වුවද 2025 මැයි 20 දින වනවිට එම ඉඩම අසංවර්ධිත තත්ත්වයේ පැවති අතර, එහි ජනාවාස ඇති කිරීමක් හෝ වගාවක් හෝ ස්ථාපිත කිරීමක් සිදුකර නොතිබුණි.<br><br>තවද, මෙම ඉඩමෙන් 2005 අප්‍රේල් 30 දින එවකට කොත්මලේ නේවාසික ව්‍යාපාර කළමනාකාර විසින් මානව සම්පත් | කොත්මලේ ව්‍යාපාරය සඳහා ජනාවාස ඇති කිරීමේ අරමුණින් කොටගල හැරින්ටන් වතුයායේ වාරින් ක්‍රොස් ඉඩමෙන් අක්කර 48 ක් පමණ පවරා අත්පත් කරගෙන ඇති අතර ඉන් හෙක්. 10.31 පමණ ලංකා කම්කරු ක්‍රොන්ග්‍රස් ආයතනය වෙත දීර්ඝකාලීන බදු පදනම මත ලබා දී ඇති අතර ඉතිරි හෙක්. 9.26 ක් වූ බිම් ප්‍රමාණය මානව සම්පත් සංවර්ධන සමිතිය වෙත දීර්ඝකාලීන බදු පදනම මත ලබා දී ඇත.<br><br>කලාපීය කමිටුවක් මගින් මෙම ඉඩම් කොටස් දෙක විධිමත්ව පරීක්ෂා කර ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමි. | හිඟ බදු කඩිනමින් අයකර ගැනීමට කටයුතු කිරීමටත්, තවදුරටත් එකඟවූ පරිදි සංවර්ධනය නොකරන්නේ නම් බදු අයිතිය අවලංගු කිරීමටත් කටයුතු කළයුතුය.<br><br>තවද නීත්‍යානුකූල බදු ගිවිසුම්වලට නොඑළඹීම සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන ඔවුන්ට එරෙහිව විනය පරීක්ෂණ පවත්වා |

| | | | |
|---|---|---|---|
| | සංවර්ධන සමිතිය වෙත අක්කර 22.88 ක් වූ ඉඩම් බදු ගැනීම සම්බන්ධව සමිති ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන නොමැති අවස්ථාවක දීර්ඝකාලීන බදු බලපත්‍රයක් මඟින් බදුදීම නිර්දේශ කර තිබුණි. සමිතියකට ඉඩමක් බැහැර කිරීමේ හැකියාවක් පවතින්නේ වසර 05 ක උපරිමයකට යටත්ව පමණක් වන අතර, 2025 මාර්තු 17 වනවිට මෙම ඉඩම බදුදී වසර 20 කට අධික කාලයක් ගතවී තිබුණි. මෙම ඉඩමෙහි බදු කාලය 2017 ඔක්තෝබර් 31 දිනෙන් පසු දීර්ඝ කර නොමැති අතර, 2024 දෙසැම්බර් 31 දින වනවිට රු.මිලියන 1.67 ක හිඟ මුදලක් පැවතියද නීත්‍යානුකූල බදු ගිවිසුමක් දෙපාර්ශවය අතර ඇති කර නොගැනීම හේතුවෙන් හිඟ බදු මුදල අයකර ගැනීමේදී ගැටලුකාරී තත්ත්වයක් ඇති විය හැකි බව නිරීක්ෂණය විය. | | රජයට සිදුවී ඇති පාඩු අයකර ගැනීමට කටයුතු කළයුතුය. |
| (ඌ) | මහවැලි කලාප තුළ දේශගුණික අවබලපෑම් අවම කිරීම සඳහා ක්‍රියාත්මක කිරීමට යෝජිත අධි තාක්ෂණික හරිතාගාර ස්ථාපිත කිරීම සඳහා වන නියමු ව්‍යාපෘතිය 2019 වර්ෂයේදී පුද්ගලික සමාගමක් වෙත කොත්මලේ පැරණි කොට්ඨාශ කාර්යාල පරිශ්‍රයේ ඇති හෙක්ටයාර 0.3035 ක භූමියක් ලබාදී තිබුණි. මෙම ව්‍යාපෘතිය මඟින් මහවැලි කලාපවල (වික්ටෝරියා හා එච් කලාපයේ) මහවැලි නිලධාරීන් හා ගොවීන් 100 දෙනෙකු සඳහා තාක්ෂණික පුහුණුව ලබාදීමටත්, රැකියා අවස්ථා ලබාදීමටත් එකඟවී තිබුණි. එසේ වුවද, 2019 වර්ෂයේ සිට මෙම සමාගම විසින් භුක්ති විඳින මෙම ඉඩම් කොටස සඳහා එදින සිට මේ දක්වා කිසිදු බදු මුදලක් අයකර නොතිබුණු අතර මිනින්දෝරු සැලැස්මක් සකසා විධිමත් ලෙස බැහැර කර නොතිබුණි. 2024 දෙසැම්බර් 18 දින සිදුකරන ලද ක්ෂේත්‍ර පරීක්ෂාවේදී මෙහි හරිතාගාර දෙකක් ඉදිකොට වගාවක් පවත්වාගෙන යන බව නිරීක්ෂණය වූ අතර, එකඟ වූ පරිදි මහවැලි නිලධාරීන් හා ගොවීන් වෙනුවෙන් පුහුණු කටයුතු කිසිවක් සිදුකර නොතිබුණි. | ගිවිසුමට අනුව ඉඩමේ වටිනාකමින් වාර්ෂිකව සියයට 4 ක බදු මුදලක් අය කළයුතු වුවද මේ වනතුරු අය කිරීමට නොහැකිවී ඇත. එම හේතුව වනුයේ අදාළ ලේඛන නිසි පරිදි නොලැබීමත් හා ආයතනය විසින් මාගේ ලිපිවලට පිළිතුරු නොදීමත් යන කරුණුය.<br><br>ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව ලද පසු අදාළ ගාස්තු අය කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | කඩිනමින් හිඟ බදු අයකර ගැනීමටත් විධිමත් ලෙස ඉඩම් බැහැර කිරීමටත් කටයුතු කළයුතු අතර, නියමු ව්‍යාපෘතියේ ප්‍රතිලාභ ලබාගැනීමට ක්‍රියාමාර්ග ගතයුතුය. |
| (එ) | 2019 වසර දක්වා සී/ස මහවැලි සත්ව ව්‍යාපාරික සමාගමට බදුදී ඇති අධිකාරියේ තඹුත්තේගම පිහිටි අක්කර 25 කින් යුත් නිරාවිය ගොවිපලෙහි බදු කාලය දීර්ඝ කිරීමට හෝ එම ඉඩම නැවත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම සමාගම මේ වන විට පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශය යටතේ ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ අධීක්ෂණය යටතේ පවතින සමාගමක් ලෙස ක්‍රියාත්මක වේ. මෙම ගැටළු විසඳා ගැනීම සඳහා දෙපාර්ශවය අතර | කඩිනමින් නව බදු ගිවිසුමකට එළඹීමට හෝ ඉඩම නැවත පවරා ගැනීමට කටයුතු කළයුතුය. |

| | | | |
|---|---|---|---|
| | | පවතින රාජකාරිමය ලිපි ලේඛන හුවමාරු කරගත් අතර ඒවා අධ්‍යයනය කර මෙම ගැටලු විසදා ගැනීමට අපේක්ෂා කරමි. | |
| (ඒ) | සූර්යය බලශක්ති ආයෝජන ව්‍යාපෘති ස්ථාපනය කිරීම වෙනුවෙන් 2017 හා 2018 වර්ෂවලදී අධිකාරිය විසින් හෙක්. 1728.304 ක භූමි ප්‍රදේශයක් ආයෝජකයින් 191 දෙනෙකු වෙත බදුදීම සඳහා වෙන්කර දී තිබුණද, 2025 මැයි 20 වනවිට ආයෝජකයින් 08 දෙනෙකු පමණක් විදුලි ජනනය ආරම්භ කර තිබුණි. එසේ ආරම්භ නොකළ ඉඩම් වෙනත් ආයෝජකයින් වෙත ලබාදීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | කොවිඩ් වසංගතය සහ අනතුරුව එළඹි ආර්ථික පසුබෑස්ම හමුවේ ආයෝජකයින් ඉදිරිපත් නොවීම මත මෙම කාර්යය සඳහා කල් ගතවූ නමුත් මේ වන විට සැලකිය යුතු ප්‍රගතියක් අත් කරගෙන ඇත. තවද, අධිකාරිය විසින් ඉඩම් බැහැර කිරීම සඳහා එකඟතාව පමණක් ලබා දී තිබූ අතර සියළු අනුමැතීන් අදාළ ආයෝජකයින් විසින් සම්පූර්ණ කළයුතු වේ. අදාළ අනුමැතීන් සියල්ල ලද පසු පමණක් ඉඩම් නිදහස් කිරීමේ කටයුතු ආරම්භ කරනු ලැබේ. | එකඟවූ පරිදි ව්‍යාපෘති ආරම්භ නොකරන ලද ඉඩම් අවලංගු කිරීමටත්, එම ඉඩම් නව ආයෝජකයින් වෙත බැහැර කිරීමටත් අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමටත් කටයුතු කළ යුතුය. |
| (ඔ) | 1993 ජුනි 01 දින අවබෝධතා ගිවිසුමකින් අධිකාරියට අයත්ව තිබූ දිගන විලේජ් රිසෝට් සමඟ අක්කර 07 ක ඉඩම සහ සියලු ගෘහ භාණ්ඩ හා උපකරණ පුද්ගලික සමාගමකට පවරාදී තිබුණද, තවත් අක්කර 03 ක පමණ ප්‍රදේශයක් අනීතිකව සමාගම භුක්තිවිඳ තිබුණි. 2022 නොවැම්බර් 21 දිනැති නඩු තීන්දුව අනුව 2023 පෙබරවාරි 26 දින හෝ එදිනට පෙර නියමිත පරිදි පරිශ්‍රය අධිකාරිය වෙත භාරදිය යුතු වුවත්, විධිමත්ව දේපල නැවත භාරදීමකින් තොරව සමාගම පරිශ්‍රයෙන් ඉවත්වී ගොස් තිබුණු අතර, 2024 දෙසැම්බර් 31 දින වන විට පරිශ්‍රයේ මෙහෙයුම් කටයුතු නතරවී වසරක් ඉක්මවා ඇති නමුත්, එම පරිශ්‍රය විනාශවීමට ඉඩහැර තිබුණි. තවද, 1993 වර්ෂයේ සිට මෙම පරිශ්‍රය බාහිර පුද්ගලයන් හා ආයතන වෙත විවිධ උත්සව කටයුතු සහ නේවාසික පහසුකම් සඳහා ලබාදී ආදායම් උපයා තිබුණද, අධිකාරිය වෙත කිසිදු මුදලක් ගෙවා නොතිබුණු අතර, ලැබිය යුතු ලෙස ගණනය කර ඇති මුදල රු.මිලියන 4.5 ක් විය. | 2025.01.16 දින මෙම පරිශ්‍රයේ නීත්‍යානුකූල භුක්තිය අධිකාරියට පවරා දෙන ලදී. මේ වන විට අදාළ පරිශ්‍රය ප්‍රතිසංස්කරණය කරමින් පවතී. එසේම නිත්‍යානුකූල භුක්තිය අධිකාරියට ලබා දීමෙන් පසු මෙතෙක් සිදුව ඇති හානිය සම්බන්ධයෙන් තක්සේරු කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස 2025.03.24 දිනැතිව නීති අංශය මඟින් දැනුම් දී ඇති අතර ඒ අනුව මේ වන විට හානිය තක්සේරු කිරීම අදාළ කටයුතු සිදු කරනු ලබන අතර තක්සේරුව ලද වහාම අදාළ මුදල් අය කර ගැනීමට නීත්‍යානුකූලව කටයුතු කරනු ලැබේ. | හිඟ බදු මුදල කඩිනමින් අයකර ගැනීමටත්, අදාළ ගොඩනැගිල්ලට හා එහි වූ ගෘහ භාණ්ඩවලට සිදුවී ඇති හානිය තක්සේරු කර ඒවා වගකිවයුතු පාර්ශවයන්ගෙන් කඩිනමින් අයකර ගැනීමටත් කටයුතු කළයුතුය. තවද මෙම ගොඩනැගිල්ල තවදුරටත් විනාශවීමට ඉඩ නොදී අළුත්වැඩියා කර එමඟින් ආදායම් උපයා ගැනීමට කටයුතු කළයුතුය. |
| (ඕ) | කොත්මලේ ප්‍රදේශයේ පිහිටි අධිකාරියේ නිල නිවසක්, කොත්මලේ කඳවුරු භූමියේ ඇති ගොඩනැගිල්ලක් හා දොරගල වතු බංගලාව ඇතුළු ගොඩනැගිලි සහිත හෙක්ටයාර 1.311 ක පමණ වන ඉඩම අවස්ථා කිහිපයකදී ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව වෙත ලබාදී ඇතත් විධිමත් බදු | විධිමත් බදු ගිවිසුමක් යටතේ ඉඩම් බැහැර කිරීම සිදු කර නොමැති බව පිළිගන්නා අතර නේවාසික ව්‍යාපාර කළමනාකාරවරයකුගේ අත්සනින් කොන්දේසි සහිතව ඉඩම් භාර දීමක් පමණක් සිදුකර ඇත. | රජයේ තක්සේරුව ලබාගෙන කඩිනමින් විධිමත් බදු ගිවිසුම්වලට එළඹීමටත්, බදු කුලී අයකර ගැනීමටත් කටයුතු කළයුතු |

| | | | |
|---|---|---|---|
| | ගිවිසුමක් නොතිබුණු අතර, ගොඩනැගිලි වෙනුවෙන් රජයේ තක්සේරුව ලබාගෙන නොතිබුණි. මෙම ගොඩනැගිලිවලින් 57 බී දරන නිල නිවස සඳහා පමණක් මාසිකව රු.3,000 ක කුලී මුදලක් අයවන අතර, අනිකුත් කිසිදු ගොඩනැගිල්ලකින් අධිකාරියට කිසිදු කුලී මුදලක් අය කර නොතිබුණි. | අංක 57 බී දරණ නිල නිවාසය සඳහා හා වතු බංගලාව සඳහා කුලිය අය කිරීමට ගිවිසුම් සකස් කර ඇති අතර නිවාස කමිටුවේ නිර්දේශ මෙතෙක් නොලැබීම හේතුවෙන් එම කටයුතු ප්‍රමාදවී ඇත. | අතර, විධිමත් බදු ගිවිසුම්වලට නොඑළඹීම හා රජයේ තක්සේරුව ලබා නොගැනීම සම්බන්ධයෙන් වගකිවයුතු නිලධාරීන් සඳහා විනය ක්‍රියාමාර්ග ගතයුතුය. |
| (ක) | අධිකාරියට අයත් අනුබද්ධිත සමාගමක් වන ස්වභාවික සම්පත් කළමනාකරණ (පුද්) සමාගම ඈවර කිරීමට අමාත්‍ය මණ්ඩලය 2019 වර්ෂයේදී තීරණය කර තිබුණද, සමාලෝචිත වර්ෂය අවසාන වන විටද ඈවර කිරීමේ කටයුතු අවසන් කර නොතිබුණි. | සමාගම ඈවර කිරීමේ කටයුතු සඳහා ඈවරකරුවන් පත්කර ඇත. ඈවරකරුවන් සිය රාජකාරි මේ වන විටත් සිදුකරගෙන යනු ලබයි. | සමාගම ඈවර කිරීමේ කටයුතු කඩිනමින් නිම කළයුතුය. |
| (ග) | මහවැලි අධිකාරියේ මූල්‍ය ප්‍රකාශනවල මහවැලි පශු සම්පත් හා කෘෂි ව්‍යාපාරික (පුද්) සමාගමේ ආයෝජන ලෙස රු.මිලියන 406.38 ක් දක්වා තිබූ අතර එම සමාගම මහවැලි අධිකාරියේ අනුබද්ධිත සමාගමක් ලෙසද දක්වා තිබුණි. මෙම සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලියේද සමාගම මහවැලි අධිකාරියේ අනුබද්ධිත සමාගමක් ලෙස දක්වා තිබුණද, අධිකාරිය වෙනුවෙන් එකදු කොටසක්වත් සමාගම විසින් නිකුත් කර නොතිබුණි. | 2023 වර්ෂයේදී එක් කොටසක් ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය වෙත පවරා ගෙන ඇත. ඉතිරි කොටස් 02 ක පවරා ගැනීමට අදාළව සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව වෙත ඊට අදාළ ලිපි ලේඛන භාර දී ඇත. මේ වන විට එම කාර්ය සිදුවෙමින් පවතී. | අධිකාරියේ නමින් කොටස් නිකුත් කළයුතුය. |
| (ච) | මූල්‍ය ප්‍රකාශන අනුව ආයෝජන ව්‍යාපෘතිවලින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.මිලියන 171.37 ක් අයකර ගත යුතුව පැවතුණ අතර එයින් රු.මිලියන 43.98 ක් වසර 05 කට අධික කාලයක සිට අයකර ගැනීමට නොහැකිව තිබුණි. තවද, අධිකාරියේ බී, සී, ජී, එච් හා එල් කලාපවල භූමිය පෞද්ගලික දුරකතන සමාගම් වෙත දුරකතන කුළුණු ඉදිකිරීම වෙනුවෙන් බදුදීමෙන් 2024 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 11.75 ක මුදලක් අයවිය යුතුව තිබුණි.<br>ඊට අමතරව විගණනයට ලද තොරතුරු අනුව වලව, රඹකැන්ඔය සහ බී කලාපයේ උපරිම වසර 32 සිට අවම වසර 6 දක්වා වන කාලපරිච්ඡේදයක් තුළ ආයෝජන ව්‍යාපෘති 166 ක් සඳහා බැහැර කළ ඉඩම් වෙනුවෙන් රජයේ තක්සේරුව ලබා නොගෙන දළ තක්සේරුව මත පදනම්ව බදු අයකර තිබුණි. | පිළිගනිමි. අදාළ පාර්ශව දැනුවත් කර හිඟ මුදල් අයකර ගැනීමටත් එසේ නොවේ නම් නෛතික ක්‍රියාමාර්ග ගැනීමටත් කටයුතු කරමි. | අය වියයුතු මුදල් අයකර ගැනීමට හා රජයේ තක්සේරුව ලබාගෙන ඒමත බදු අය කිරීමට කඩිනමින් කටයුතු කළයුතුය. |

| | | | |
|---|---|---|---|
| (ජ) | කොළඹ 05, ජාවත්ත පාර, වරිපනම් අංක 11 දරන දේපල, කොළඹ 05, ජාවත්ත පාර, වරිපනම් අංක 04 දරන දේපල, මහවැලි කේන්ද්‍රය, බෞද්ධාලෝක මාවතේ, සරණ පාර පිහිටි නිවාස සංකීර්ණය හා රත්මලාන යාන්ත්‍රික වැඩපල අයත් පරිශ්‍රය පිහිටි ඉඩම්වල අයිතිය නිරවුල් කර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් රේඛීය අමාත්‍යාංශ ලේකම්තුමා සමඟ සාකච්ඡා කර විධිමත් පදනමක් මත මහවැලි අධිකාරිය සතු ගොඩනැගිලි බාහිර ආයතන වෙත කුලී පදනම මත ලබාදීමට අපේක්ෂා කරමි. | මෙම ඉඩම්වල අයිතිය කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කළයුතුය. |
| (ට) | 2020 දෙසැම්බර් 14 දිනැති අංක අමප/20/1852/317/012 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් කළුගල් ව්‍යාපාරිකයින්ගෙන් අය වියයුතු හිඟ ඉඩම් පරිහරණ ගාස්තු මුදලින් සියයට 75 ක් කපා හැරීමටත්, ඉතිරිය වාරික 36 කින් අයකර ගැනීමටත් තීරණය කර තිබුණු අතර, 2023 අගෝස්තු 10 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේදී නිසි පරිදි ගෙවීම් නොකරන ආයෝජකයින්ට එරෙහිව කඩිනමින් පොදු දේපල පනත යටතේ නඩු පවරන ලෙසද උපදෙස් ලබාදී තිබුණි.<br><br>එසේ වුවද සහන ලබාගත් කැනීම්කරුවන් 25 දෙනෙකුගෙන් අය වියයුතු ඉඩම් පරිහරණ ගාස්තුව රු.මිලියන 64.92 න් කිසිදු මුදලක් අයකර ගැනීමට අධිකාරියට නොහැකිවී තිබුණි. තවද, හිඟ ඉඩම් පරිහරණ ගාස්තුව ගෙවා නිම කිරීමට ලබාදුන් සහන කාලපරිච්ඡේදය 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වී තිබූ කැනීම්කරුවන් 23 කු වෙත ලබාදුන් සහනය අවභාවිතා කරමින් ගෙවිය යුතු මුදල් කුඩා ප්‍රමාණවලින් ගෙවීම් කරමින් පවතින බවත් ඔවුන්ගෙන් තවදුරටත් අයවිය යුතු රු.මිලියන 149.32 ක් බවත් නිරීක්ෂණය විය.<br><br>එසේම ඉහත අමාත්‍ය මණ්ඩලය තීරණය මඟින් සහන ලබාදුන් කැනීම්කරුවන් අතරින් 12 දෙනෙකු මහා පරිමාණ ඉදිකිරීම් සමාගම් හා ව්‍යාපාරිකයින් වන අතර, මොවුන්ගෙන් එවකට අයවිය යුතුව තිබූ හිඟ ඉඩම් පරිහරණ ගාස්තුව රු.මිලියන 1,313.95 විය. එය මුළු අයවිය යුතු ඉඩම් පරිහරණ ගාස්තුවෙන් සියයට 69 ක් තරම් ඉහළ අගයක් විය. | එම අය විසින් ගෙවිය යුතු ඉඩම් පරිහරණ ගාස්තුව ගෙවීම් කරන ලෙස දන්වා ඇතත්, එම ගාස්තු ගෙවීම ආරම්භ කර නොමැති ව්‍යාපෘතිකරුවන් සඳහා 1982 අංක 12 දරන පොදු දේපළ විෂයෙහිලා සිදුකරනු ලබන වැරදි පිළිබඳව පනත යටතේ නඩු පැවරීමට කටයුතු කර ඇත.<br><br>2020-12-14 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව, ගණනය කිරීම් සිදුකර හිඟ ගාස්තු අයකිරීම ආරම්භ කරන ලෙස ආයෝජකයින් දැනුවත් කරනු ලැබුවද 2021,2022 හා 2023 වර්ෂවල පැවති කොවිඩ් වසංගත හා රට තුළ පුපුරණ ද්‍රව්‍ය හිඟතාවයක් පැවතීම හේතුවෙන් අදාළ වර්ෂවල කැණීම් ව්‍යාපෘති ක්‍රියාත්මක වීම දුර්වල මට්ටමක පැවතීම හේතුවෙන් හිඟ ගාස්තු ගෙවීමේ පසුබෑමක්ද ඇතිවී ඇත. එම ආයෝජකයින් 23 දෙනා සම්බන්ධයෙන්ද නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇත. | අයවිය යුතු ඉඩම් පරිහරණ ගාස්තු තවදුරටත් ප්‍රමාද නොකර අයකර ගැනීමට කටයුතු කළයුතුය.<br>අයකළ යුතු හිඟ ඉඩම් පරිහරණ ගාස්තු කපා හැරීමට තීරණය කිරීමේදී අනුගමනය කල ක්‍රියාවලිය සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වා එහිදී යම් අක්‍රමිකතාවයක් සිදුවී තිබේද යන්න සොයා බලා අවශ්‍ය කටයුතු කළ යුතුය. |
| (ඩ) | මහනැඟුම මාර්ග ඉදිකිරීමේ සමාගම වලව කලාපයේ මයුරපුර ඒකකයේ හෙක්ටයාර 1.2141 වූ භූමියක කළුගල් කැනීම 2010 වර්ෂයේදී ආරම්භ කොට 2015 වර්ෂයේදී | සමාගම විසින් අදාළ ඉඩමෙන් 2015 වර්ෂයෙන් පසු ඉවත්වී අතහැර දමා ගොස් ඇති බැවින්, එම අගල් ½ කළුගල් කියුබ් 813.5 සහ ABC | 2024 අගෝස්තු 16 දින පුද්ගලික සමාගමකට ඉඩම් බැහැර කිරීමේදී |

| | | | |
|---|---|---|---|
| | නවතා දමා තිබූ අතර, අගල් ½ කළුගල් සහ ABC මිශ්‍රණයන් ගොඩගසා අතහැර දමා ගොස් තිබුණි. මෙම කළුගල් පිහිටි ඉඩම 2024 අගෝස්තු 16 දින පුද්ගලික සමාගමක් වෙත බැහැර කර තිබූ අතර, එසේ බැහැර කිරීමේදී මෙම කළුගල්වල තක්සේරු වටිනාකම ලබාගැනීමට හෝ කැනීම් කරන ලද කළුගල් ප්‍රමාණය ඉවත් කිරීමට හෝ කටයුතු කර නොතිබුණි. කොට්ඨාශ කළමනාකාර (මයුරපුර) විසින් 2025 ජනවාරි 27 දින ස්ථානීය පරීක්ෂාවක් සිදුකළ බවත්, එහිදී දළ වශයෙන් අගල් ½ කළුගල් කියුබ් 813.5 ක් සහ ABC මිශ්‍රණයන් කියුබ් 1138 ක් පමණ ගොඩගසා ඇති බවත් නේවාසික ව්‍යාපාර කළමනාකාර (වලව) වෙත දැනුම්දී තිබුණි.<br>එසේ වුවද 2025 මාර්තු 05 දින සිදුකළ ක්ෂේත්‍ර විගණන පරීක්ෂාවේදී මෙම ගොඩගසා තිබූ කළුගල් වෙනත් පාර්ශවයක් විසින් ඉවත් කරගෙන ඇති බව නිරීක්ෂණය විය. | මිශ්‍රණයන් කියුබ් 1138 ක ප්‍රමාණය නිශ්චිතව ගණනය කිරීමෙන් පසු ඊට අදාළව ඉදිරි කටයුතු විධිමත් පරිදි සිදු කරනු ලබයි. | කැනීම් කරන ලද කළුගල් ප්‍රමාණය ඉවත් කර ගැනීමට කටයුතු නොකර වගකීම් පැහැර හැරි නිලධාරීන් සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ග ගතයුතුය. |
| (ණ) | අධිකාරියට අයත් ගොඩනැගිලි ආයතන 11 ක් ව්‍යාපෘති 04 ක් සඳහා ලබාදී තිබුණද ඒවාට අදාළ ජල විදුලි හා පවිත්‍රතා බිල්පත් ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් ගෙවා තිබුණි. 2024 දෙසැම්බර් 31 දින වනවිට අදාළ ආයතන විසින් ප්‍රතිපූරණය නොකළ හිඟ ජල, විදුලි හා පවිත්‍රතා බිල්පත්වල වටිනාකම රු.මිලියන 15.62 වුවද එම මුදල් අයකර ගැනීමට අවශ්‍ය පියවර ගෙන නොතිබුණි. | මේ සම්බන්ධයෙන් රේඛීය අමාත්‍යාංශ ලේකම්තුමා සමඟ සාකච්ඡා කර විධිමත් පදනමක් මත අධිකාරිය සතු ගොඩනැගිලි බාහිර ආයතන වෙත කුලී පදනම මත ලබාදීමට අපේක්ෂා කරමි.<br><br>ප්‍රතිපූර්ණ විය යුතු මුදල් පිළිබඳව අදාළ ආයතන වෙත දැනුම් දී ඇත. එම ආයතනවලින් මෙම අධිකාරිය වෙත ජල, විදුලි හා පවිත්‍රතා සේවා සැපයීම වෙනුවෙන් තවදුරටත් අයවීමට ඇති හිඟ මුදල රු.12,243,589.22 කි. | හිඟ ජල, විදුලි හා පවිත්‍රතා ගාස්තු අයකර ගතයුතුය. |
| (ත) | අධිකාරියට අයත් ගබඩා 43 ක් 2009 වර්ෂයේ සිට වී අලෙවි මණ්ඩලය විසින් භාවිතා කරනු ලැබුවද, එම ගබඩාවල අයිතිය වී අලෙවි මණ්ඩලය වෙත පවරා දීමට හෝ කුලී අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | එම ගබඩා, කුලී ගෙවීමෙන් නිදහස් කර වී අලෙවි මණ්ඩලය වෙත පවරා ගැනිමට අනුමැතිය ලබා ගැනිම පිණිස අමාත්‍ය මණ්ඩල අනුමැතියක් ලබා ගෙන ඉදිරිපත් කරන ලෙසත් එසේ නොවේ නම් අදාළ බදුකුලී ගෙවීමට වී අලෙවි මණ්ඩලය එකඟ නොවන්නේ නම් එම ආයතනය පිහිටුවන ලද පනතේ රජයේ ඉඩම් නොමිලේ ලබාගැනීම සඳහා හැකියාව පවතින බවට ප්‍රතිපාදන තිබේනම් එම පනතේ පිටපතක්ද සමග මා වෙත කඩිනමින් දැනුම් දෙන ලෙස සභාපති, වී අලෙවි මණ්ඩලය වෙත දැනුම් දි තිබුණද ඒ සඳහා ප්‍රතිචාර නොදැක්වීම හේතුවෙන් | ගබඩා විධිමත්ව පැවරීමට හෝ කුලී අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගතයුතුය. |

| | | | |
|---|---|---|---|
| | | හා සිහිකැඳවීම් ලිපිය සඳහාද කිසිදු ප්‍රතිචාරයක් නොදැක්වීම මත “අවසාන දැනුම් දීම” ලෙස 2025.07.04 දිනැතිව සභාපති වී අලෙවි මණ්ඩලය වෙත ලිපියක් යොමු කර ඇත. එහි ප්‍රගතිය අනුව ඉදිරි කටයුතු සිදු කරමි. | |
| (ද) | 1979 අංක 07 දරන රජයේ ඉඩම් (සන්තකය ආපසු ලබාගැනීමේ) පනතෙහි 180 වගන්තිය අනුව අනවසර අල්ලා ගැනීම් සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගෙන නොතිබූ අවස්ථා පහත පරිදි විය. | | |
| (i) | විගණනයට ලද තොරතුරු අනුව අධිකාරියෙහි කලාප 10 හි අනවසරකරුවන් 6259 ක් අක්කර 5370 ක් අත්පත් කරගෙන තිබුණි. එසේ වුවද නඩු කටයුතු ආරම්භ කර ඇත්තේ මෙයින් අක්කර 369 ක් සඳහා පමණක් විය. තවද, 2023 මැයි 23 දිනෙන් පසු එච් කලාපයේ මීගලෑව කොට්ඨාශයේ අක්කර 1.575 ක් ද රඹකැන්ඔය කලාපයේ අක්කර 72.6 ක් ද, වික්ටෝරියා කලාපයේ අක්කර 87.5ක් ද අධිකාරිය විසින් අත්පත් කරගත් ඉඩම් නැවත අල්ලා ගෙන තිබුණි. | දක්වා ඇති කලාප 10 හි අනවසරකරුවන් විසින් අදාළ ඉඩම් කොටස් දීර්ඝ කාලයක සිට මේ දක්වා අවිධිමත් ලෙස භුක්ති විඳිනු ලබන හෙයින්ද ඔවුන් විසින් මේ වන විට සංවර්ධන කටයුතු සිදුකර ඇති බැවින්ද එම ඉඩම් කොටස් භුක්ති විඳිනු ලබන පුද්ගලයින් විධිමත් කිරීම සඳහා කලාප මට්ටමින් කටයුතු සිදුකරමින් පවතී. | අනවසරකරුවන් ඉවත් කර අධිකාරිය සතු සංවේදී කලාප හා ප්‍රදේශ ආරක්ෂා කර ගැනීමට ක්‍රියාමාර්ග ගතයුතුය. |
| (ii) | අධිකාරිය විසින් පෞද්ගලික සමාගමකට ආයෝජන ව්‍යාපෘතියක් සඳහා සී කලාපයේ ගිරාඳුරුකෝට්ටේ ඒකකයේ උල්හිටිය ජලාශයට යාබදව බැහැර කර ඇති අක්කර 511.52 ක ඉඩම්වලට මැදිව පිහිටි අක්කර 50 ක පමණ භූමි ප්‍රමාණයක් එහි අයිතිය ප්‍රකාශ කරමින් පෞද්ගලික පාර්ශවයක් විසින් 2014 මාර්තු 15 දින සිට 2024 මාර්තු 14 දින දක්වා වූ වසර 10 ක කාලසීමාවකට පෞද්ගලික සමාගමකට වගාවක් සඳහා රු.මිලියන 6.52 ක මුදලකට බදුදී තිබුණි. මෙම භූමියේ අයිතිය තහවුරු කරගැනීම සඳහා නෛතික ක්‍රියාමාර්ගයක් 2025 මැයි 20 දක්වාම ගෙන නොතිබුණි. | මෙම ඉඩම මේ දක්වා සින්නක්කර ඉඩමක් සේ සලකා කටයුතු කර ඇතත් උද්ගතවී ඇති ගැටලුකාරී තත්ත්වය සලකා බලා ඉඩමේ හිමිකම පිළිබඳව සවිස්තර වාර්තාවක් ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවෙන් ඉල්ලා ඇත. ඒ අනුව ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය කාර්යාලය -මහියංගනය විසින් ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස් ජනරාල් වෙතින් මේ පිළිබඳව වාර්තාවක් ලබාදෙන ලෙස ඉල්ලීම් කර ඇති බව අප වෙත දන්වා ඇත. එම වාර්තාව ලද විගසම මේ පිළිබඳව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරනු ලැබේ. | මෙම භූමියේ අයිතිය තහවුරු කරගැනීම කළයුතුය. |

| | | | |
|---|---|---|---|
| (න) | 2022 නොවැම්බර් 22 න් පසු ඉඩම් බැහැර කිරීම නතර කරන ලෙස ජනාධිපති විසින් නිර්දේශය ලබාදී තිබියදී බී, සී, ඩී ඊ, ජී, එච් හා හුරුළුවැව යන කලාප 07 ට අදාළව නේවාසික හා ගෙවතු ලෙස එකතුව ඉඩම් කට්ටි 339 ක් ද, වාණිජ ලෙස ඉඩම් කට්ටි 366 ක් ද වශයෙන් ඉඩම් බැහැර කර තිබුණි. මේ බව අනාවරණය වීමත් සමඟ ඉහළ බලතල සහිත ස්වාධීන කමිටුවක් වාරිමාර්ග අමාත්‍යාංශ ලේකම්ගේ නියමයෙන් 2023 අගෝස්තු 25 දින පත් කර තිබුණද, කමිටුවේ නිරීක්ෂණ හා නිර්දේශ සම්බන්ධයෙන් 2025 මැයි 20 දින දක්වා කටයුතු කර නොතිබුණි. | විධිමත් ක්‍රමවේදයකින් බැහැරව ඉඩම් බෙදාදීම සිදුකළ නිලධාරීන් කවුරුන්ද යන්න හඳුනා ගෙන අවශ්‍ය ක්‍රියාමාර්ග කඩිනමින් ගැනීමට කටයුතු කරමි. | කමිටුවේ නිරීක්ෂණ හා නිර්දේශ සම්බන්ධයෙන් කඩිනමින් ක්‍රියාමාර්ග ගතයුතුය. |
| (ප) | 2024 දෙසැම්බර් 31 දින වනවිට කලාප 10 හි මුළු ආයෝජන සඳහා ඉඩම් කට්ටි 797 ක් එනම් අක්කර 16143 ක් බැහැර කර තිබුණද, එයින් ඉඩම් කට්ටි 326 ක් ඌන සංවර්ධිතව පවතින බව නිරීක්ෂණය විය. | එල් කලාපය තුළ විවිධ හේතුන් මත ඉඩම් කොටස් 17 ක් ඌන සංවර්ධන මට්ටමේ පවතී.<br><br>මහවැලි බී කලාපය තුළ ඌන සංවර්ධන මට්ටමේ පවතින්නේ ව්‍යාපෘති 74 ක ප්‍රමාණයක් පමණි. එම ව්‍යාපෘති හිමිකරුවෙකුටද අදාළ ඉඩම සංවර්ධනය කරන මෙන් දන්වා ඇත. මෙම ඌන සංවර්ධිත ඉඩම්ද තවදුරටත් සංවර්ධනය නොකරන්නේ නම් බදු අයිතිය අවලංගු කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි.<br><br>මහවැලි සී කලාපයේ වෙහෙරගල කොට්ඨාසය තුළ ආයෝජන ව්‍යාපෘති සඳහා බැහැර කර තිබූ ඌන සංවර්ධිත ඉඩම් දෙකක් අවලංගු කර ඇති අතර තවත් එක් ඉඩමක් අවලංගු කිරීමේ කටයුතු මේ වන විට සිදුකරමින් පවතී. ඉතිරි කොට්ඨාසවල ඌන සංවර්ධිත ඉඩම් 15 ක් අවලංගු කිරීමේ කටයුතු ආරම්භ කර ඇත.<br><br>මොරගහකන්ද කලාපයේ පාරිසරික තත්ත්වය අනුව මෙම ඉඩම් කොටස් අපේක්ෂිත සංවර්ධනයට යොදා ගැනීම පමාවී ඇත.<br><br>වික්ටෝරියා / ඊ කලාපයේ ආයෝජන ව්‍යාපෘති සඳහා බැහැර කරන ලද ඉඩම් කට්ටි ප්‍රමාණය 36 කි. ඉන් ඉඩම් කට්ටි 03 ක් අවලංගු කර ඇත. ඉතිරි ඉඩම් කට්ටි 33 න් ඉඩම් කට්ටි 11ක් ඌණ | සංවර්ධනය නොකරන ලද හා ඌන සංවර්ධිත සියළුම ඉඩම්වල බදු අයිතිය අවලංගු කර නැවත පවරා ගෙන සුදුසු කාර්යයන් සඳහා භාවිතා කිරීම කළයුතුය. |

| | | | |
|---|---|---|---|
| | | සංවර්ධිතව පවතින බව ක්ෂේත්‍ර පරීක්ෂාවේදී තහවුරු විය. වලව කලාපය තුළ දැනට සංවර්ධන කටයුතු සිදුකර නොමැති ආයෝජන ව්‍යාපෘති අවලංගු කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. ඒ අතරින් දැනටමත් ව්‍යාපෘති 21 ක් සඳහා දැන්වීම් යොමු කර ඇත.<br><br>එච් කලාපයේ ඌන සංවර්ධිතව පවතින ඉඩම් කැබලි 06 කි.<br><br>මෙම ඉඩම් කොටස් සඳහා දැනට බදු අය කිරීම සිදුකරනු ලැබේ. ඒසේම මෙම ඌන සංවර්ධිත ඉඩම් කට්ටි 03 ක් අවලංගු කිරීමට දැනට හඳුනාගෙන ඇත.<br><br>රඹකැන්ඔය කලාපයේ ආයොජන ව්‍යාපෘති 10 ක් සඳහා ඉඩම් කැබලි 10 න් ඌන සංවර්ධනයේ පැවති ඉඩම් 04 ක් අවලංගු කිරීමට කටයුතු කර ඇත. අවලංගු කිරීමට ඇති ඉඩම්වලින් අයවීමට ඇති හිඟ බදු මුදල් අය කිරීම සඳහා අධ්‍යක්ෂ (නීති) වෙත යොමුකර ඇත. | |
| (ඛ) | මහවැලි ඉඩම් බැහැර කිරීම සඳහා ජාතික ප්‍රතිපත්තියක් නොතිබුණු අතර, සීමිත සම්පතක් වන ඉඩම් විනිවිදභාවයකින් යුතුව කෘෂිකර්මාන්තය, පදිංචිය, කර්මාන්ත හා සංචාරක මෙන්ම පාරිසරික සමතුලිතතාවය සඳහා වඩාත් සැලසුම්සහගත හා විද්‍යාත්මක ප්‍රවේශයක් ඔස්සේ බැහැර කර නොතිබුණි. | මහවැලි ඉඩම් බැහැර කිරීම මහවැලි මහ සැලැස්මේ අරමුණු අනුව එක් එක් කලාප සඳහා සිදුකර ඇති ව්‍යුහාත්මක සැලසුම් මත පදනම්ව සිදුකරනු ලබන අතර, මූලිකව යෝජිත භූමියට අදාළ මූලික ඉඩම් තොරතුරු, යෝජිත ඉඩමේ වර්තමාන තත්ත්වය, යාබද ඉඩම් පරිහරණය යන මූලික කරුණු හා කෘෂි, තාක්ෂණ, සමාජ, ආර්ථික හා පාරිසරික අංග කෙරෙහි කලාප මට්ටමේදී අවධානය යොමුකරනු ලබන අතර, සමස්ත ව්‍යුහයට සිදුවන බලපෑම හා අනෙකුත් කලාප සඳහා ඇතිවිය හැකි බලපෑම් සැලකිල්ලට ගෙන අධ්‍යක්ෂ (ඉඩම් පරිහරණ සැලසුම්) ගේ නිර්දේශ ලබාදෙමින් වඩාත් සැලසුම් සහගතව හා විද්‍යාත්මක ක්‍රමවේද ඔස්සේ භෞතික සැලසුම් නිර්දේශ ලබාදෙන අතර, නිර්දේශ ලබාදෙනු ලබන සියළු ඉඩම් භූගෝලීය දත්ත තොරතුරු පද්ධතිය හරහා යාවත්කාලීන කිරීම සිදුකරනු ලබයි. | මහවැලි ඉඩම් බැහැර කිරීම සඳහා ජාතික ප්‍රතිපත්තියක් හඳුන්වාදී භෞතික සැලසුම් නිර්දේශ අනුගමනය කර ඉඩම් ආඥා පනතේ විධිවිධාන ප්‍රකාරව විද්‍යාත්මක ක්‍රමවේදයක් මත ඉඩම් බැහැර කළයුතුය. |

| | | | |
|---|---|---|---|
| (ම) | කෘෂිකාර්මික හා ව්‍යාපාර සංවර්ධන කාර්යයන් වෙනුවෙන් දිගුකාලීන බදු පදනම මත මහවැලි බලප්‍රදේශවල ඉඩම් ලබාදීමේදීද ලබාදිය හැකි ඉඩම් ප්‍රමාණය ප්‍රදේශ අනුව සුදුසු ආයෝජන ව්‍යාපෘති, ලබාදිය හැකි අවම හා උපරිම ඉඩම් ප්‍රමාණය පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කළ නිශ්චිත හා පැහැදිලි ප්‍රතිපත්තියක්ද නොතිබුණි. ආයෝජන ව්‍යාපෘති සඳහා ඉඩම් ලබාදීමේදී පුද්ගලයින්ගේ ඉල්ලීම් අනුව ඉඩම් ලබාදී තිබුණ අතර, ආයෝජකයින් තෝරා ගැනීම පිළිබඳ නිර්නායක හඳුනාගෙන නොතිබුණි.<br><br>තවද 1979 අංක 23 දරන ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය පනතේ 3 වගන්තිය අනුව ඉඩම් පරිහරණය සඳහා මූලික ව්‍යූහාත්මක සැලසුම් සකස් කර තිබුණද, 2011 වර්ෂයෙන් පසු වර්තමාන ඉඩම් පරිහරණ අවශ්‍යතා අනුව එම ව්‍යූහාත්මක සැලසුම් යාවත්කාලීන කර නොතිබුණි. | ආයෝජන ව්‍යාපෘති වාර්තා ඇගයීම් කමිටුවක් මගින් ඇගයීමට ලක්කර අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය යටතේ විධිමත් ක්‍රමවේදයට අනුකූලව ඉඩම් බැහැර කිරීම සිදුකරනු ලබයි.<br>මහවැලි කලාප සඳහා ව්‍යුහාත්මක සැලසුම් සැකසීම අනාගත වර්ෂ 20 ක පමණ සංවර්ධන අවශ්‍යතා සැලකිල්ලට ගෙන සිදුකරනු ලබන අතර, 2011 වර්ෂයේදී සිදුකර ඇති සංශෝධනද වසර 20 ක කාලීන අවශ්‍යතා සැලකිල්ලට ගනිමින් සිදුකර ඇත. ඒ අනුව, කාලානුරූපව ඉදිරිපත් වන විශේෂ අවශ්‍යතා සැලසුමට අනුව කලාපීය භෞතික සැලසුම් නිර්දේශ මත පදනම්ව සැලකිල්ලට ගෙන සංශෝධනය කරනු ලබන අතර, 2030 වර්ෂයේදී මීලඟ සැලසුම් සංශෝධනය සිදුකිරීමට අපේක්ෂා කරනු ලබයි. | ආයෝජකයන් තෝරා ගැනීමේ නිර්නායක හඳුන්වා දී ඒ අනුව ආයෝජකයන් තෝරා ගතයුතු අතර, ඉඩම් පරිහරණ අවශ්‍යතා අනුව ව්‍යුහාත්මක සැලසුම් යාවත්කාලීන කළයුතුය. |
| (ය) | 2018 වර්ෂයේදී වැලිඔය ගජබාපුර සිට නැදුන්කර්නි හන්දිය දක්වා වූ මාර්ගය ඉදිකිරීම සඳහා ගෙවීම් කිරීමේදී රු.මිලියන 43.36 ක වැඩිපුර ගෙවීම මාර්ග සංවර්ධන අධිකාරියෙන් අයකර ගැනීමට මේ දක්වාම කටයුතු කර නොතිබුණි. | වැලිඔය ගජබාපුර සිට නැදුන්කර්නි හංදිය දක්වා මාර්ගය ඉදිකිරීම සඳහා 2018 වර්ෂයේදී මාර්ග සංවර්ධන අධිකාරිය වෙත රු.390,085,714 ක මුදලක් ලබා දුන් අතර එහි ඉතිරි මුදල වන රු.43,363,909.15 සඳහා සම්පත් නුවර සිට ගජබාපුර දක්වා මාර්ගයේ කි.මී. 1.9 ක කොටසක් නවීකරණය කිරීමට මාර්ග සංවර්ධන අධිකාරිය එකඟ වූ අතර ඉන් කොටසක් පමණක් නවීකරණය කර එම කොන්ත්‍රාත්තුව අවලංගු කර ඇත. ඒ අනුව මෙම තාවකාලික නවීකරණ කටයුත්ත සඳහා රු.17,556,259.24 ක මුදලක් වැයවී ඇති බව මාර්ග සංවර්ධන අධිකාරිය විසින් නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (තා/සේවා) වෙත ලිඛිතව දන්වා ඇත. බැවින් ඉතිරි මුදල වන රු.25,797,649.92 ක මුදල ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය වෙත නැවත ගෙවීම් කරන බව දන්වා මාර්ග සංවර්ධන අධිකාරියේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (ඉදිකිරීම්) දැනුම් දී ඇත. | වැඩිපුර ගෙවූ මුදල අයකර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ර) | 2025 මාර්තු 24 දිනැති ENV/GEN/Audit Report-2023 දරන අධ්‍යක්ෂ (වන හා පරිසර) ගේ ලිපිය අනුව 2024 නොවැම්බර් 30 දින වනවිට භූමි පුනරුත්ථාපන ගාස්තු අයකර නොමැති කළුගල් ව්‍යාපෘති 21 ක් ක්‍රියාත්මක වෙමින් පවතින බව නිරීක්ෂණය විය. | 2024 නොවැම්බර් 30 දිනට භූමි පුනරුත්ථාපන ගාස්තු අයකර නොමැති ව්‍යාපෘති 21 ක්‍රියාත්මත වෙමින් පවතින බව සඳහන් වුවද, එම ව්‍යාපෘති 21 පිළිබඳ වර්තමාන ප්‍රගතිය ඇමුණුම මගින් යාකර ඇත. | කඩිනමින් භූමි පුනරුත්ථාපන ගාස්තු අයකර ගැනීමට කටයුතු කළයුතුය. |
| (ල) | වැලි කැනීම්වල පරිසර හානි අවම කිරීමට මහවැලි ගඟ දෙපස මීටර 60 ක රක්ෂිත මායිම් සලකුණු කිරීම සඳහා 2018 වර්ෂයේදී හා 2019 වර්ෂයේදී එකතුව රු.මිලියන 1.61 ක් මිනින්දෝරු දෙපාර්තමේන්තුවට ගෙවා තිබුණද, විගණිත දින වූ 2025 මැයි 20 දක්වා රක්ෂිත මායිම් සලකුණු කිරීම සිදුකර නොතිබුණි. | මැනුම් කටයුතු මේ වන විට අවසන් කර ඇත. මායිම් පෙන්වාදීම සඳහා ඉදිරියේදී කටයුතු කරනු ලබන බව මිනින්දෝරු දෙපාර්තමේන්තුව මගින් අප අධිකාරිය දැනුවත් කර ඇත. | රක්ෂිත මායිම් සළකුණු කර ගැනීමට කඩිනමින් පියවර ගතයුතුය. |
| (ව) | මහවැලි සී කලාපයේ වැලි කැනීම සඳහා මංකඩ බලපත්‍ර ලබාදීමේදී සිදුවී ඇති අක්‍රමිකතා සම්බන්ධව වාරිමාර්ග අමාත්‍යාංශය විසින් සිදුකළ මූලික විමර්ශන වාර්තාව අනුව රාජ්‍ය සම්පත් සාවද්‍ය පරිහරණය කිරීමට ඉඩහැරීම සම්බන්ධයෙන් හිටපු නේවාසික ව්‍යාපාර කළමනාකරුවන්ට එරෙහිව ආයතන සංග්‍රහයට අනුව කටයුතු කිරීමටත්, ඛනිජ ද්‍රව්‍ය කැනීම් සම්බන්ධව සම්පූර්ණ වගකීම දැරූ ඉඩම් පරිහරණ අංශයේ හිටපු අධ්‍යක්ෂකට එරෙහිව ආයතන සංග්‍රහයේ 02 වන උපලේඛනයේ වරදක් සිදුකිරිම සම්බන්ධව කටයුතු කිරීමටත් නිර්දේශ කර තිබුණි. එසේ වුවද 2025 මැයි 20 දින වනවිටත් වැරදිකරුවන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගැනීම හෝ මුදල් අයකර ගැනීම සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | සි කලාපයේ වැලි කැනිම් මංකඩ බලපත්‍ර ලබා දිමේදි සිදුව ඇති අක්‍රමිකතා සම්බන්ධයෙන් සිදුකළ මුලික විමර්ශන වාර්තාවේ නිර්දේශ අනුව වගකිවයුතු නිලධාරීන් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව කටයුතු සිදු කරන ලෙසට දැනුම් දි ඇත. ඒ සම්බන්ධව නියෝජ්‍ය අධ්‍යක්ෂ (නිති) දැනුවත් කළ පසුව නිතිපති දෙපාර්තමේන්තුව විසින් නියෝජ්‍ය අධ්‍යක්ෂ (නිති) වෙත දන්වා ඇත්තේ විශ්‍රාමික නිලධාරින් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව කටයුතු කිරිමේ හැකියාවක් නොමැති බවයි.<br>ඒ අනුව නියෝජ්‍ය අධ්‍යක්ෂ (නිති) විසින් නේවාසික ව්‍යාපාර කළමනාකාර (සි) වෙත 2024.07.04 දිනැතිව ලිපියක් යොමු කර වැලි මංකඩලාභින්ට එරෙහිව පොදු දේපල පනත යටතේ නඩු පැවරිමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස දැනුම්දි ඇත. | අධිකාරියට සිදුකළ මූල්‍ය අලාභය අයකර ගතයුතුය. |
| (ස) | අධිකාරිය විසින් නියාමනය නොකරන නමුත්, මහවැලි විශේෂ බලප්‍රදේශ තුළ විදුලි ජනනයේ යෙදී සිටින කුඩා පරිමාණයේ ජල විදුලි බලාගාර 65 කින් ජල පෝෂක ප්‍රදේශ කළමනාකරණ ගාස්තුව අයකර ගැනීම සඳහා විධිමත් ගිවිසුම්වලට එළඹ නොතිබුණි. | මෙම බලාගාර සඳහා වසර 15 ක කාලයක් වලංගු වන පරිදි පරිසර ආරක්ෂණ බලපත්‍රය නිකුත් කර ඇති අතර එකී බලපත්‍රය යාවත්කාලීන කිරීමේදී මහවැලි අධිකාරියට මෙම ව්‍යාපෘති සඳහා නැවත මැදිහත් වීමට හැකියාව ලැබෙන බැවින් ඉදිරියේදී මේ පිළිබඳව කටයුතු කිරීමට සහ සුදුසු පරිදි ගිවිසුම්ගත වීමට බලාපොරොත්තු වේ. | මෙම බලාගාරවලින් ජල පෝෂක ප්‍රදේශ කළමනාකරණ ගාස්තුවක් අයකර ගැනීමට සුදුසු ක්‍රමවේදයක් ස්ථාපිත කළයුතුය. |

| | | | |
|---|---|---|---|
| (හ) | අධිකාරියේ සම්පත් යොදා ආරම්භ කරන ලද මහවැලි පශු සම්පත් හා කෘෂි ව්‍යාපාරික (පුද්) සමාගම තෝරාගත් බාහිර ආයෝජකයකු සමඟ රාජ්‍ය පෞද්ගලික හවුල් ව්‍යාපාරයක් ලෙස ප්‍රතිසංවිධානය කිරීම සඳහා 2018 වර්ෂයේදී අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාදී තිබුණද, එම කාර්යයන් සිදුකර නොතිබුණි. | නව රජයේ ප්‍රතිපත්තියට අනුව මෙවැනි ගොවිපලවල් ප්‍රදේශයේ ගොවිජනතාවගේ දායකත්වයද ඇතිව සංවර්ධනය කිරීම අරමුණු කොට ඇති බැවින් නව අධ්‍යක්ෂ මණ්ඩලයක් පත් කර සමාගම නැවත ප්‍රතිසංවිධානය කිරීමට සැලසුම් කර ඇත. | සමාගම ප්‍රතිසංවිධානය කිරීමට කටයුතු කළයුතුය. |
| (අඅ) | මහනුවර දිස්ත්‍රික්කයේ, කඩවත්සතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් ගැටඹේ ග්‍රාම නිලධාරී වසම තුළ මහවැලි ගඟට මැදිවන ලෙස පිහිටා ඇති දූපත පිහිටි ප්‍රදේශය වරාතැන්න, හත්කිඳ පාරිසරික ආරක්ෂණ කලාපය ලෙස 2017 ජූනි 19 දින 2024/06 දරන ගැසට් පත්‍රය මගින් වෙන්කර තිබුණද මෙම ප්‍රදේශයේ පිහිටි අවන්හල සහිත බිම් කොටස වාර්ෂික බදු පදනම මත බැහැර කිරීමට 2024 අගෝස්තු 09 වන දින අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාදී තිබුණි. | මෙම අවන්හල පාරිසරික ආරක්ෂණ ප්‍රදේශය ප්‍රකාශයට පත් කිරීමට පෙර සිට පවත්වාගෙන ආ ව්‍යාපාරික ස්ථානයක් බැවින්, අවන්හල බදු පදනම මත ලබාදීමට අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබාදී ඇත. ඒ අනුව බදු පදනම මත ලබා දීම සඳහා රජයේ තක්සේරුව ඉල්ලුම් කළත් මෙතෙක් තක්සේරුව ලැබී නොමැත. | මෙම දූපත පිහිටි ප්‍රදේශය පාරිසරික ආරක්ෂණ කලාපය-ක් ලෙස පවත්වාගෙන යාමට අවශ්‍ය වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කළයුතුය. |
| (ආආ) | තඹුත්තේගම නිරාවිය ගොවිපලෙහි අක්කර 146 ක භූමි භාගයක් කෘෂිකාර්මික කටයුතු සඳහා ගිවිසුම්වලට එළඹීමකින් තොරව 2020 වර්ෂයේ යුධහමුදාවට භාරදී තිබුණි. එහිදී යුධහමුදා නිලධාරීන් ගොවිපොළෙහි සංචාරක බංගලාවේ හා නිල නිවාසවල රැඳී සිටියද කිසිදු අයකිරීමක් අධිකාරිය විසින් සිදුකර නොතිබුණි. | නිරාවිය ගොවිපල භූමිය තුලින් ශ්‍රී ලංකා යුධ හමුදාව වෙත ලබා දී ඇති භූමි කොටස තවදුරටත් ශ්‍රී ලංකා යුධ හමුදාව යටතේම පවත්වාගෙන යාමට අමාත්‍ය මණ්ඩලය අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව අදාළ කුලී මුදල් අයකර ගැනීම සම්බන්ධව (ගොඩනැගිලි භාවිතය හා එහි ජලය හා විදුලිය භාවිතය ආදිය) දෙපාර්ශවය මේ වන විටත් සාකච්ඡා පවත්වාගෙන යයි. | සංචාරක බංගලාව හා නිල නිවාසය සඳහා ගාස්තු හා කුලී මුදල් අයකර ගතයුතුය. |
| (ඇඇ) | විදුලි බලය නිෂ්පාදනය කිරීම සඳහා වික්ටෝරියා, රන්දෙනිගල, රන්ටැඹේ, කොත්මලේ, බෝවතැන්න, මාදුරුඔය, පොල්ගොල්ල හා උඩවලව ජලාශවලින් ජලය රඳවාගෙන නිකුත් කරනු ලබන අතර, එම ජලාශ නඩත්තුව හා මෙහෙයවීම වෙනුවෙන් අධිකාරිය වාර්ෂිකව විශාල වැය බරක් දරනු ලැබේ. 2024 වර්ෂයේදී ද ජල විදුලි බලය නිපදවීම වෙනුවෙන් මෙම ජලාශවලින් ජල කියුබ් 11106 ක් මුදාහැර තිබූ අතර, ඉන් 2273.1 ක විදුලිබල නිෂ්පාදනය සිදුකර තිබුණද කිසිදු මුදලක් අධිකාරිය අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | විදුලිබල නිෂ්පාදනයට සහ ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය වෙත නිකුත් කරනු ලබන ජලය වෙනුවෙන් අධිකාරියට කිසිදු ගෙවීමක් මෙතෙක් කරනු නොලබන බව පිළිගනිමි. මේ සම්බන්ධව ලංකා විදුලිබල මණ්ඩලය සහ ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය සමඟ සාකච්ඡාවන් කිහිපයක්ම සිදුකළ අතර එකී ආයතන වෙතින් ඒ සඳහා සාර්ථක පිළිතුරක් මෙතෙක් ලැබී නොමැත. | විදුලි ජනනය සඳහා නිදහස් කරන ජලය වෙනුවෙන් සාධාරණ ගාස්තුවක් අය කිරීමට වැඩපිළිවෙලක් හඳුන්වා දියයුතුය. |

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2016 හා 2018 වර්ෂවලදී ඉඩම් තොරතුරු පද්ධතියක් ස්ථාපිත කර ක්‍රියාත්මක කිරීම සඳහා රු.මිලියන 6.97 ක් වැයකර නිලධාරීන් 60 ක් පුහුණු කර තිබුණද, 2025 මැයි 20 වනවිටද ඉඩම් කළමනාකරණ තොරතුරු පද්ධතිය ක්‍රියාත්මක නොවීම නිසා එම වියදම නිෂ්කාර්ය වියදමක් බවට පත්වී තිබුණි. | ශ්‍රී ලංකා මහවැලි බල ප්‍රදේශයේ පවතින සියළුම ඉඩම් තොරතුරුවල දත්ත ගබඩා කිරීමේ අරමුණ ඇතිව 2016 වර්ෂයේ e-Slims වැඩසටහනට ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ නියෝජිතායතනයේ උපදෙස් හා මඟපෙන්වීම මත පුද්ගලික ආයතනයක් වෙත මෙම පද්ධතිය සංවර්ධනය කිරීමේ කටයුතු 2016 වර්ෂයේ ගිවිසුම් ගතව භාර දී ඇත.<br>2016 -2017 වර්ෂය තුළ දත්ත පද්ධතියේ සංවර්ධිත කටයුතු සිදු කරමින් රජයේ ඉඩම් ආඥා පනතට අදාල ඉඩම් කැබලි 5000 කට අධික ප්‍රමාණයක දත්ත පද්ධතියට ඇතුළත් කර ඇත. 2017 වර්ෂයෙන් ගිවිසුම් ගත වූ කාලසීමාවට වාර්ෂිකව වැය කෙරෙන ප්‍රතිපාදන හිඟතාවය හා රට තුළ පැවති කොරෝනා වසංගත තත්ත්වය මත මෙම වැඩසටහන සඳහා තවදුරටත් ගිවිසුම්ගත වීමට නොහැකිවී ඇත.<br>නැවත e-Slim පද්ධතිය මහවැලි අධිකාරිය තුළ ක්‍රියාත්මක කිරීමේ ප්‍රසම්පාදන කටයුතු අවසන් කර ඇති අතර අදාළ සමාගම සමඟ ගිවිසුම් ගතවී ඇත. | කඩිනමින් මෙම තොරතුරු පද්ධතිය ක්‍රියාත්මක කිරීමට කටයුතු කළයුතුය. |
| (ආ) | කන්තලේ සූරියපුර මහවැලි ගඟේ ආරක්ෂණ වේල්ලට ප්‍රතිවිරුද්ධ ඉවුරේ තැන්පත්වී ඇති වැලි නිධිය කැනීම් කර අලෙවි කර උපයා ගන්නා ලාභයෙන් ඛාදනයට ලක්වී ඇති ගංවතුර ආරක්ෂණ වේල්ල ප්‍රතිසංස්කරණය කිරීමට ව්‍යාපෘතියක් 2019 අගෝස්තු 06 දින ආරම්භ කර තිබුණි. බැම්ම ප්‍රතිසංස්කරණය මාස 06 ක් තුළ නිම කිරීමට 2019 අප්‍රේල් 01 එකඟවී අනතුරුව 2022 ජුලි 19 දින දක්වා අවස්ථා කිහිපයකදී කාලය දීර්ඝ කර තිබුණි. ප්‍රමුඛ කාර්යයක් ලෙස 2019 වර්ෂයේ ආරම්භ කළ මෙම ව්‍යාපෘතිය වසර 05 කුත් මාස 08 ක් ගතවී ඇතත් 2025 මැයි 20 වන විටත් නිම කර නොතිබුණි. | මහවැලි ගඟේ ගංවතුර ආරක්ෂණ වේල්ල ඛාදනයවී ඇති තුම්මෝදර නමැති ස්ථානයේ පිහිටා ඇති වැලි නිධිය ඉවත් කිරීම හා ගංවතුර ආරක්ෂණ වේල්ල සකස් කිරීම, සිදු කර දෙන ලෙස සූරියපුර ගොවි සංවිධානය විසින් කරන ලද ඉල්ලීම අනුව නීතිපති දෙපාර්තමේන්තුවේ තීරණ අනුව වැලි කියුබ් 103128 ක පමණ ප්‍රමාණයක් ඉවත් කිරීම සඳහා ව්‍යාපෘතිය ආරම්භ කළත් ප්‍රදේශයේ පවතින අනෙක් තොටුපොළ හිමියන්ගේ විරෝධය, කොවිඩ් වසංගතය තත්ත්වය, කාලගුණික තත්ත්වයන් හේතුවෙන් ගිවිසුම්ගත කාලය තුළ ව්‍යාපෘතිය අවසන් කිරීමට නොහැකිවී ඇත. | පවතින ගැටලු කඩිනමින් නිරාකරණය කර ව්‍යාපෘතිය නිම කිරීමට ක්‍රියාමාර්ග ගතයුතුය. |
| (ඇ) | මොරගහකන්ද ජලාශය ඉදිකිරීම හේතුවෙන් නිවාස දේපල අහිමිවූ ජනතාව නැවත පදිංචි කිරීමේ කටයුතු 2012 වර්ෂයේදී ආරම්භ කර 2022 නොවැම්බර් වනවිට අවසන්වී තිබුණද, මෙසේ නැවත පදිංචි කළ | මොරගහකන්ද කලාපයේ ඉදි කරන්නට යෙදුණු මොරගහකන්ද ජලාශය වෙනුවෙන් එම ප්‍රදේශවල ජීවත් වූ ජනතාව ලග්ගල වැල්ලෙවෙල හා ගුරුවෙල ප්‍රදේශවල පදිංචි කරන ලද අතර | තවදුරටත් ප්‍රමාදයකින් තොරව ජානපදිකයින් හට ඉඩම් ලබාදීමට හා |

| | | |
|---|---|---|
| ජනතාවට බීමට සහ අනෙකුත් කටයුතු සඳහා අවශ්‍ය වන ජල සැපයීම පිළිබඳ සැලසුම් සකස් කර නොතිබුණි. මේ හේතුවෙන් 2025 මැයි 20 දින වනවිටත් වැල්ලේවෙල සහ නව ගුරුවෙල පදිංචි කළ පවුල් 473 ක් වෙනුවෙන් බීමට සහ අනෙකුත් අවශ්‍යතා වෙනුවෙන් දෛනිකව බවුසර් රථ මඟින් ජලය ලබාදීමට සිදුවී තිබුණ අතර, 2023 වර්ෂයේ රු.මිලියන 40.73 ක් හා 2024 වර්ෂයේ රු.මිලියන 45.37 ක් ඒ සඳහා වැය කර තිබුණි.<br><br>තවද, මෙසේ නැවත පදිංචි කළ ජනතාව අතුරින් පවුල් 161 ක් සඳහා කුඹුරු ඉඩම් ලබාදී නොතිබීම හේතුවෙන් ඔවුන්ගේ ජීවනෝපාය අහිමිවී තිබුණ බැවින් ආරම්භයේදී ව්‍යාපෘතියෙන්ද, 2022 ජූලි මස සිට අධිකාරිය මඟින්ද එකතුව රු.මිලියන 20.65 ක් මෙම නැවත පදිංචිකරුවන්ට වියළි ආහාර ලබාදීමට 2024 වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිට වැය කර තිබුණි. | එම ජනතාව සඳහා ජල පහසුකම් සපයා නොතිබීම නිසා බවුසර් මඟින් පානීය හා ගෘහස්ථ ජලය සැපයීම සඳහා මොරගහකන්ද කළුගඟ ව්‍යාපෘතිය මඟින් පියවර ගෙන තිබුණි.<br><br>ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් අප වෙත දන්වා ඇති ආකාරයට 2025 අගෝස්තු මස වන විට ජල සැපයුම යථා තත්ත්වයට පත් කර ක්‍රමානුකූලව ජනතාව වෙත පානීය ජලය ලබා දීමට කටයුතු සිදු කරමින් පවතින බව දන්වා සිටිමි.<br><br>ඉදිරියේදී ඉඩම් බැහැර කිරීම සඳහා කටයුතු කළ හැකිව ඇති බැවින් ඉඩම් බැහැර කොට පළමු අස්වැන්න ලබාගත් පසු වියළි ආහාර සලාක ලබාදීම නවතාලිය හැකි බව සඳහන් කරනු කැමැත්තෙමි. | ජල පහසුකම් සපයාදීම කළයුතුය. |

**3.4 මතභේදයට තුඩු දෙන ගනුදෙනු**

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රත්නපුර දිස්ත්‍රික්කයේ ජනතාවගේ ජීවන තත්ත්වය නගා සිටුවීම උදෙසා වලව කලාපය තුළ නව කොට්ඨාශ කාර්යාල තුනක් ගොඩකවෙල, වැලිගෙපොල හා කොළොන්න යන බලප්‍රදේශ තුළ 2024 වර්ෂයේ ස්ථාපනය කර තිබුණි. මෙම කාර්යාල පිහිටුවීම සඳහා මූලිකව රු.මිලියන 4.02 ක් වැයකර තිබූ අතර, ඊට අමතරව මාසිකව ගොඩනැගිලි කුලී වශයෙන් රු.100,000 ක මුදලක්ද 2025 අප්‍රේල් මාසය දක්වා ගෙවා තිබුණි. මෙම කාර්යාල පිහිටි භූමිය තුළ ඉඩම් පරිපාලන කටයුතු හා වාරි පද්ධති නඩත්තු කිරීම මහවැලි අධිකාරිය විසින් සිදුනොකරන අතර, මෙම කාර්යාල තුන මඟින් ප්‍රධාන වශයෙන් සිදුකරනුයේ ද්‍රව්‍ය ආධාර බෙදාදීම පමණක් විය. | වලව කලාපය මේ වන විට කොට්ඨාස 10 කින් සමන්විතව සංවර්ධන කාර්යයන් ඉටු කරනු ලබන මහවැලි කලාපයකි. නමුත් 2024.02.20 දින වන තෙක් වලව කාලාපය සංවර්ධන කාර්යයන් කොට්ඨාස 06 ක් මූලික කර ගනිමින් සිදු කරන ලදි.<br>2024.02.20 වන දින කොළොන්න බල ප්‍රදේශයට අයත් ග්‍රාම නිළධාරී කොට්ඨාසයක් මහවැලි අධිකාරිය හරහා සංවර්ධන කළයුතු බව ගැසට් පත්‍රයක් මඟින් ප්‍රකාශයට පත් කිරීමත් සමඟ 07 වන කොට්ඨාසය ලෙස කොළොන්න කොට්ඨාසය වලව කලාපයේ සංවර්ධන බල ප්‍රදේශයට එක් විය.<br><br>2024.05.14 වන දින අධ්‍යක්ෂ මණ්ඩලය අනුමැතිය ලබාදී ඇති සංශෝධිත ක්‍රියාත්මක සැලැස්ම සකස් කරන අවස්ථාව වන විට වැලිගෙපොල, ගොඩකවෙල හා සෙවනගල යන කොට්ඨාස කාර්යාල | අලුතින් කොට්ඨාශ කාර්යාල ඉදිකිරීමට පෙර ඒවායේ යෝග්‍යතාවය නිසි පරිදි පරීක්ෂා කිරීමට වැඩපිළිවෙලක් හඳුන්වා දියයුතුය. |

| | | | |
|---|---|---|---|
| | | පිහිටුවා නොතිබීම හේතුවෙන් මාගේද උපදෙස් පරිදි නව කොට්ඨාසයේ ජනපදිකයින්ගේ සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා වෙන්කර ගැනීම සඳහා ක්‍රියාත්මක සැලැස්ම හරහා යෝජනා කළ අතර ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා දී ඇත. | |
| (ආ) | වලව කලාපයේ පමණක් පාසැල් ළමුන් සඳහා රු.මිලියන 47.2 ක් වටිනා පාසැල් පොත් 385,000 ක් 2024 වර්ෂයේදී මිලදී ගෙන තිබුණි. මෙම වැඩසටහන පසුව කරන ලද සංශෝධිත ක්‍රියාකාරී සැලසුම්වල ඇතුළත් කර තිබුණු අතර, මැතිවරණ කොමිෂන් සභාව මඟින් ප්‍රකාශයට පත් කරන ලද අංක 2394/56 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයෙන් ජනාධිපති මැතිවරණ කාලසීමාව තුළ එනම් 2024 ජූලි 26 දින සිට 2024 සැප්තැම්බර් 21 දින දක්වා මෙවැනි වැඩසටහන් ක්‍රියාත්මක කිරීම අත්හිටුවා ඇති කාලය තුළදී මෙය සිදුකර තිබුණි. | 2024 වර්ෂය සඳහා ක්‍රියාත්මක සැලැස්ම වලව කලාපයේ ක්‍රියාත්මක වූ පැරණි කොට්ඨාස 06 මූලික කර ගනිමින් සකස් කර අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගෙන තිබුණි.<br><br>ඉන් පසුව වලව කලාපයේ සංවර්ධන කටයුතු සිදු වෙමින් පවතින කොට්ඨාස 06 ට අමතරව නව සංවර්ධන කොට්ඨාසයක් ලෙස ග්‍රාමසේවා වසම් 29 කින් සමන්විත කොළොන්න කොට්ඨාසයත්, පෙර කියාත්මක වූ චන්ද්‍රිකාවැව කොට්ඨාසයේ සංවර්ධන බල ප්‍රදේශය සඳහා නව ග්‍රාමසේවා වසම් 18 ද එක් කරමින් වලව කලාපයේ සංවර්ධන භූමි ප්‍රමාණය දිගු කිරීමක් සිදු කරන බව අමාත්‍යාංශ ලේකම් විසින් දන්වා ඇත.<br>අධ්‍යක්ෂ ජනරාල් විසින් ලබා දුන් උපදෙස් පරිදි වලව කලාපයට අයත් සියළුම කොට්ඨාස ආවරණය වන පරිදි කලාපයේ පාසල් ළමුන් සඳහා අභ්‍යාස පොත් ලබා දීමේ යෝජිත ක්‍රියාකාරකමද ඇතුළත් කර සංශෝධිත ක්‍රියාත්මක සැලැස්ම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අධ්‍යනය කර 2024.05.14 වන දින අනුමැතිය ලබා දී ඇත. | මැතිවරණ කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද අතිවිශේෂ ගැසට් පත්‍රයට පටහැනිව කටයුතු කිරීම සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වා අදාළ නිලධාරීන්ට විනය පරීක්ෂණ පැවැත්විය යුතුය. |
| (ඇ) | 2024 වර්ෂයේදී වල්සපුගල ප්‍රදේශයේ ඉඩම් හෙක්ටයාර 135.75 ක් සූර්යබල ව්‍යාපෘති සඳහා සමාගම් 12 ක් වෙත බැහැර කිරීමේදී ඒ සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන සියළු පාර්ශවයන්ට ඉදිරිපත්වීමට ප්‍රසිද්ධ මාධ්‍ය ඔස්සේ දැනුවත් කිරීම් සිදුනොකොට, තෝරා ගත් පිරිසකට අධිකාරිය සතු ඉඩම් ලබාදීමට අවස්ථාව සලසා දී තිබුණි. | ප්‍රධාන වශයෙන් ආයතන තුනක් මෙහිදී සම්බන්ධ වේ. එනම්, නියාමන ආයතනය ලෙස ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියත්, විදුලිය මිලදී ගන්නා ආයතනය ලෙස ලංකා විදුලිබල මණ්ඩලයත් ඉඩම් හිමිකරු ලෙස ශ්‍රී ලංකා මහවැලි අධිකාරියද ඇතුළත් තවත් ආයතන කිහිපයක්ද විය. | ව්‍යාපෘති සඳහා ඉඩම් බැහැර කිරීමේදී උනන්දුවක් දක්වන සියලු පාර්ශවයන්ට ඉදිරිපත්වීමට හැකි ලෙස ප්‍රසිද්ධ මාධ්‍ය ඔස්සේ දැනුවත් කිරීමට වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කළයුතුය. |

| | | | |
|---|---|---|---|
| | | ඒ අනුව මෙම සියළු ආයතන එක්ව ව්‍යාපෘති ඇගයීම් කමිටුවක් (Project Approving Committee - PAC) සකස් කර ඇති අතර, එම කමිටුව මගින් අදාළ ඇගයීම් සිදුකරනු ලබයි. මෙහිදී විදුලිය මිලදී ගනු ලබනුයේ සම්මත මිල ගණන් මත පමණක් වන බැවින් සහ එවකට ක්ෂේත්‍රයේ තිබූ විදුලිබල ඉල්ලුම සහ රජයට ආයෝජන සඳහා මුදල් වෙන් කිරීමේ හැකියාව අවමව පැවතීම මත ආයෝජකයින් වෙතින් ලද යෝජනා සළකා බලා ශක්‍ය ආයෝජකයින් තෝරාගනිමින් ඉදිරියට රැගෙනවිත් ඇත. | |
| (ඇ) | පාරිසරික වශයෙන් ඉතා සංවේදී හා අලි ඇතුන් විශාල ලෙස ගැවසෙන හා වන අලි කළමනාකරණ කලාපය ආසන්නව පිහිටි ශ්‍රී ලංකාවේ කටු පඳුරු සහිත ශුෂ්ක වනාන්තර ලෙස සැලකෙන මෙම භූමි ප්‍රදේශය සූර්යබල ව්‍යාපෘති සඳහා වෙන් කිරීමේදී අදාළ ආයතන සමඟ සාකච්ඡා කිරීම හා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීම සිදු නොකර මෙම ඉඩම් ලබාදී තිබුණි.<br><br>තවද, අක්කර 50 ට වැඩි ඉඩම් බැහැර කිරීමේදී අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගතයුතු බැවින්, මෙම තෝරාගත් සමාගම් 12 වෙත කොටස් වශයෙන් ඉඩම් ලබාදීමට කටයුතු කර තිබුණ අතර, මැනුම්වලට අදාළ ලේඛන ව්‍යාජ ලෙස සකස් කර මිනින්දෝරු දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර මිනින්දෝරු දෙපාර්තමේන්තුවෙන් නිල වශයෙන් මෙම මිනුමට අදාළ තොරතුරු අධිකාරිය වෙත ලැබී නොතිබියදී හා මිනුම් සම්බන්ධ ගැටලු පවතින බව වගකිවයුතු පාර්ශව දැනුවත්ව සිටියදී මෙසේ ඉඩම් බැහැර කිරීමට කටයුතු කර තිබුණි. | රට තුළ සහ ආයතනය තුළ පැවති ස්ථිර තනතුරු සඳහා පත්වීම් ලබාදීමේ ගැටලුකාරී තත්ත්වය සහ ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් නොසිටීම වැනි කරුණු මත වරින්වර නිලධාරී ස්ථාන මාරුවීම් සිදුකර ඇත. එසේ වුවද, කිසිවෙකුට හෝ අනීතික කාරණා සඳහා ඉඩ ප්‍රස්ථාව ලබාදීම අනුමත නොකරන අතර, මෙම ව්‍යාපෘති 12ට අදාළව මේ වනවිට ආයතනික සහ රහස් පොලිසිය මගින් පරීක්‍ෂණ කරනු ලබන අතර, එකී පරීක්‍ෂණයන්වල නිර්දේශ මත කටයුතු සිදු කරන බව දන්වමි. | අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියකින් තොරව ඉඩම් ලබාදීම සම්බන්ධයෙන් හා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබාගැනීමේ අවශ්‍යතාවය මගහැර ඉඩම් බැහැර කිරීම සම්බන්ධයෙන් ආයතනික පරීක්ෂණයක් පවත්වා ඊට වගකිවයුතු නිලධාරීන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගතයුතුය. |
| (ඉ) | 2019 ජනවාරි 31 දිනැති අංක 304 දරන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී සූර්යබල ව්‍යාපෘති සඳහා ලබාදෙන ඉඩම්වලට අදාළව බදු අයකිරීම වෙනුවට ආයෝජකයා විදුලිබල මණ්ඩලය වෙතින් ලබාගන්නා මුළු මුදලින් සියයට 6 ක් ඉඩම් පරිහරණ ගාස්තු ලෙස අයකර ගන්නා ලෙස දක්වා තිබූ නමුත්, රජයේ ඉඩම් ආඥා පනත යටතේ ඉඩම් රජයේ තක්සේරු වටිනාකමින් සියයට 4 ක් වාර්ෂික බදු මුදලක් ලෙස අයකර වසර 30 ට බදුදීමට කටයුතු කර තිබුණි. | සූර්ය බලශක්ති උත්පාදන සඳහා වෙන් කරන ඉඩම් වලින් සූර්ය බලශක්තිය නිෂ්පාදනය කිරීමෙන් පසු සියයට 6 ක මුදලක් අයකරනු ලබන අතර සූර්ය බලශක්තිය නිෂ්පාදනය කිරීමට පෙර ඉඩම් ලබා දීමේ දී සියයට 4ක වාර්ෂික මුදලක් අයකරනු ලැබේ. | අධ්‍යක්ෂ මණ්ඩල තීරනය අනුව ඉඩම් පරිහරන ගාස්තු අයකිරීමට කටයුතු කළයුතු අතර, රජයේ ඉඩම් ආඥා පනත සංශෝධනය කළයුතුය. |

## 3.5 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල පිරියත හා උපකරණ

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2014 වර්ෂයේ සිට අක්‍රියව පැවති කොත්මලේ වෙල්ලෙහි නඩත්තු කටයුතු සඳහා භාවිතා කරන ලද දොඹකර යන්ත්‍රය 2017 වර්ෂයේදී රු.මිලියන 9.8 ක් වැය කර අලුත්වැඩියාවෙන් පසුව යන්ත්‍රයේ හයිඩ්‍රොලික් හෝස් පද්ධතියේ බට පිපිරීම නිසා යන්ත්‍රය තවදුරටත් භාවිතයට ගැනීමකින් තොරව පැවතුණි. | මෙම යන්ත්‍රය ධාවන තත්ත්වයට ගැනීමට ආසන්න වශයෙන් අමතර මිලියන 10ක් පමණ වැයවන බැවින් මෙය අළුත්වැඩියා කිරීම මූල්‍යමය වශයෙන් ඵලදායි නොවන බව අධ්‍යක්ෂ, ප්‍රධානවේලි හා ජලාශ මෙහෙයුම් අංශය විසින් දන්වා ඇත. | යන්ත්‍රය අළුත්වැඩියා කිරීම මූල්‍යමය වශයෙන් අවාසි සහගත වේ නම් එය අපහරණය කිරීමට කටයුතු කළයුතුය. තවද යන්ත්‍රය අළුත්වැඩියා කිරීමට ප්‍රමාදවීම හා අළුත්වැඩියාවෙන් පසු යන්ත්‍රයේ බට පිපිරීම අතර සම්බන්ධයක් පවතීද යන්න තීරණය කිරීම සඳහා පරීක්ෂණයක් පැවැත්විය යුතුය. |
| (ආ) | 2019 වර්ෂයේදී රු.මිලියන 1.75 ක පිරිවැයක් දරමින් ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේ CCTV කැමරා පද්ධතියක් ස්ථාපනය කර ඇතත්, එම පද්ධතියට අදාළ සේවා කර ගැනීම සම්බන්ධයෙන් ගිවිසුම්ගතවී නොතිබුණි. 2025 අප්‍රේල් 28 වන විටළ ස්ථාපනය කරන ලද කැමරා 25 න් අත්‍යාවශ්‍ය ස්ථාන 8 කට අදාළ කැමරා ක්‍රියාවිරහිතව තිබූ නමුත්, ඊට අදාළ අලුත්වැඩියාවන් සිදුකර ගැනීමට නොහැකිවී තිබුණි.<br><br>මීට අමතරව ප්‍රධාන ආරක්ෂක මුරපොල තුළ CCTV පද්ධතියට අදාළ මොනිටරයක් පැවතිය යුතු වුවත්, එහි පරීක්ෂණ කටයුතු සිදුකිරීමට අදාළ උපාංග සවිකර නොතිබුණි එමෙන්ම මතක ධාරිතාවය මාසයක් පැවතිය යුතු වුවත්, ස්ථාපිත පද්ධතියේ මතක ධාරිතාවය සතියක්වී තිබුණි. මේ අනුව රු.මිලියන 1.75 ක් වියදම් කර CCTV පද්ධතියක් ස්ථාපනය කර තිබූ නමුත් අපේක්ෂා කළ අරමුණු ඉටුනොවීම නිසා මෙම වියදම නිෂ්කාර්ය වියදමක්වී තිබුණි. | CCTV කැමරා පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා 2019 වර්ෂයේදී කොන්ත්‍රාත් සමාගමකට කොන්ත්‍රාත්තුවක් ප්‍රධානය කර ඇති නමුත් ගිවිසුම් ගතවීමක් සිදුකර නොමැත. එසේම අප විසින් කළ විමසීම්වලදී එම සමාගම දැනට ක්‍රියාකාරී නොවන බව අනාවරණය විය. එබැවින් නියමිත ප්‍රසම්පාදන ක්‍රමවේද අනුගමනය කරමින් වෙනත් සුදුසු ආයතනයක් සමග CCTV කැමරා පද්ධතියේ සේවා හා නඩත්තු කිරීම සඳහා කඩිනමින් ගිවිසුම් ගතවීමට කටයුතු සිදු කෙරමින් පවතී. | සුදුසු ආයතනයක් සමඟ සේවා හා නඩත්තු කිරීම වෙනුවෙන් කඩිනමින් ගිවිසුම්ගත වියයුතු අතර, අක්‍රීය කැමරා අළුත්වැඩියා කිරීමටත් කටයුතු කළයුතුය.<br><br>තවද අදාළ සේවා කිරීම් සඳහා ගිවිසුම්ගත නොවීමට වගකිවයුතු නිලධාරීන් සඳහා විනය ක්‍රියාමාර්ග ගතයුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | අධිකාරියට අයත් දෙමටගොඩ, බේස්ලයින් පාරේ පිහිටි හෙක්ටයාර 0.2139 ක ඉඩම හා ගොඩනැගිලි පරිශ්‍රය මේ වනවිට අතහැර දමා විනාශ වෙමින් පවතින අතර, 2025 මැයි 20 දින දක්වා මේ සම්බන්ධව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | අදාළ ගොඩනැගිලි හා ගෘහභාණ්ඩ හා උපකරණ ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් මහවැලි ආරක්ෂක අංශය වෙත පවරා දී ඇත.<br>තවද, 352 වන අධ්‍යක්ෂ මණ්ඩල තීරණය මගින් ඉඩම හා ගොඩනැගිල්ල ගබඩාවක් සහ වාහන අංගනයක් සඳහා ඉදිකිරීම සඳහා අභිලාෂයන් කැඳවීම සඳහා අනුමැතිය ලබා දී ඇත. එහෙත් එවකට ගත් කළමනාකරණ තීරණය මත මේ වන විට එය අක්‍රිය මට්ටමක පවතී. | ඉඩම හා ගොඩනැගිල්ල ඵලදායී කටයුත්තකට යොදා ගැනීමට කඩිනම් ක්‍රියාමාර්ග ගතයුතුය. |
| (ඈ) | මනම්පිටිය අරලගංවිල ප්‍රධාන මාර්ගයට මුහුණලා අක්කර 1.5 ක භූමි ප්‍රදේශයක් තුළ සෞදි සංවර්ධන අරමුදල යටතේ රු.මිලියන 48 ක් වැය කර 1999 වර්ෂයේදී මහල් 2 කින් යුත් කඩකාමර 36 ක් හා තනි මහල් ගොඩනැගිලි 2 කින් යුත් කඩ කාමර 12 ක් ඉදිකර තිබුණි. 2024 නොවැම්බර් 13 වන විට මහල් 2 කින් යුත් කඩකාමර 36 නිෂ්කාර්යව පැවතුණ අතර තනි මහල් දෙකේ කඩ කාමර 12 පමණක් ව්‍යාපාරික කටයුතු සඳහා විවෘතව පැවතිණි. 2025 මැයි 20 වනවිට රු.මිලියන 2.53 ක හිඟ බදු මුදලක් අයවීමට තිබුණද, ගිවිසුම්ගතවී නොමැතිවීම නිසා එම මුදල අයකර ගැනීමට නිත්‍යානුකූලව කටයුතු කිරීම ගැටලුකාරී තත්ත්වයක් තිබෙන බව නිරීක්ෂණය විය. | රියාද් වෙළඳ සංකීර්ණයට අයත් වෙළඳසැල් 2000 හා 2012 වර්ෂවලදී ටෙන්ඩර් කැඳවා ව්‍යාපාරිකයන් වෙත බැහැර කර ඇති නමුත්, ව්‍යාපාර අසාර්ථක වීම හේතුවෙන් මෙම ගොඩනැගිලි මේ දක්වා භාවිතයට ගෙන නොමැත. ඉන් අනතුරුව දීර්ඝකාලීනව භාවිතා නොවීම හේතුවෙන් මෙම ගොඩනැගිලි අබලන්ව ඇත.<br>දීර්ඝකාලීනව ගොඩනැගිල්ල භාවිතා නොකිරීම හේතුවෙන් විදුලිය හා ජලය භාවිතා නොකලද මාසිකව අයකරනු ලබන සේවා ගාස්තුව එකතුවීම හේතුවෙන් මෙහි ජලය හා විදුලිය විසන්ධි කර ඇත. එහෙයින් ගොඩනැගිලි අළුත්වැඩියාවකින් පසුව ජලය හා විදුලිය ලබා ගත යුතුව ඇත. | මෙම කඩකාමර අදාළ ප්‍රාදේශීය සභාවට පවරාදීමටත්, අනවසර පදිංචිකරුවන් ඉවත් කිරීමටත්, හිඟ බදු කඩිනමින් අයකර ගැනීමටත් කටයුතු කළයුතුය. |
| (ඉ) | ප්‍රමිතියෙන් යුත් ජල සැපයුමක් සහතික කිරීමේ අරමුණින් රු.මිලියන 80 ක් වැය කර ප්‍රති ආශ්‍රැත ජල පිරිපහදු යන්ත්‍ර 30 ක් සැපයීම, ඉදිකිරීම, සවිකිරීම හා ඊට අනුශාංගික පහසුකම් සැපයීම සඳහා 2015 වර්ෂයේදී අධිකාරිය සහ ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව අතර ගිවිසුමක් ඇති කරගෙන තිබුණි. යන්ත්‍ර ස්ථාපිත කිරීමේදී ස්ථානීය පරීක්ෂාවන් හා ඇගයීමක් සිදුකර ස්ථාන තෝරා නොගැනීම හේතුවෙන් පිරිපහදු යන්ත්‍ර 03 ක් නිෂ්කාර්යව පැවතුණු අතර, බී කලාපයේ යන්ත්‍ර 02 ක් සවිකිරීමෙන් පසු ක්‍රියාත්මක කර නොතිබුණි. බී කලාපයේ යන්ත්‍ර 03 ක් හා එල් කලාපයේ යන්ත්‍ර 02 ක් වශයෙන් යන්ත්‍ර 05ක් 2025 මැයි 20 දින වනවිට අක්‍රීය තත්ත්වයේ පැවතුණි. ජල සැපයුම් දෙපාර්තමේන්තුව සමඟ ඇති කරගත් ගිවිසුමෙහි 13 වන වගන්තිය ප්‍රකාරව වසර 10 ක කාලයක් ජල පිරිපහදු ව්‍යාපෘතියේ අත්‍යාවශ්‍ය නඩත්තු කටයුතු, සේවා සැපයීම | මෙම පිරිපහදු යන්ත්‍ර සියල්ලම ගිවිසුමක් මගින් ගොවි සංවිධාන වෙත පවරා දී ඇත. අක්‍රීය තත්ත්වයේ පවතින ජල පිරිපහදු යන්ත්‍ර පරීක්ෂා කර අත්‍යාවශ්‍ය අලුත්වැඩියාවන් සිදුකර සේවා කටයුතුද සිදු කර දෙන ලෙස අධ්‍යක්ෂ ජනරාල්, ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව වෙත අවස්ථා කිහිපයකදීම ලිඛිතව දන්වා ඇත. | යන්ත්‍ර ස්ථාපිත කිරීමේදී ස්ථානීය පරීක්ෂාවන් හා ඇගයීම් නොකර ස්ථාන තෝරා ගැනීම සම්බන්ධයෙන් වගකිවයුතු නිලධාරීන් සඳහා විනය ක්‍රියාමාර්ග ගතයුතු අතර, නිෂ්කාර්යව පවතින යන්ත්‍ර භාවිතයට ගැනීමට ක්‍රියාමාර්ග ගතයුතුය. |

| | | |
|---|---|---|
| සහ අමතර කොටස් සැපයීමට එම දෙපාර්තමේන්තුව එකඟවී තිබුණද, මෙහිදී අදාළ ගිවිසුම ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | | |

### 3.6 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මහවැලි කලාප තුළ එල්ලෙන විදුලිවැට ඉදිකිරීම ආරම්භයේදී මහවැලි අධිකාරිය හා ශ්‍රී ලංකා නව නිපයුම්කරුවන්ගේ කොමිසම එක්ව බී කලාපයේ අරලගංවිල, කන්දකාඩු, සිංහපුර අතර හා සී කලාපයේ මහවැලි පුහුණු මධ්‍යස්ථානය වටා ඉදිකර තිබුණි. මෙහිදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ අත්පොතේ 3.5 (ඉ) වගන්තියෙන් බැහැරව කොන්ත්‍රාත් පිරිනැමීම සිදුකර රු.මිලියන 22.07 ක් වූ සම්පූර්ණ කොන්ත්‍රාත් මුදලම වැඩ නිම කිරීමට පෙර අත්තිකාරම් ලෙස ගෙවා තිබුණි.<br><br>මෙම අලි වැටවල් නිසි පරිදි ඉදිකිරීම් කර ඇති බවට අධිකාරියේ තාක්ෂණ අංශය හෝ වෙනත් පාර්ශවයක් විසින් තහවුරු කර නොතිබීම හා නිසි පරිදි බිල්පත් ඉදිරිපත් නොකිරීම මත අත්තිකාරම් නිරවුල් කිරීමට නොහැකිවී තිබුණි. විගණනය විසින් භෞතිකව පරීක්ෂා කරන ලද ස්ථානවල අලිවැට විනාශවී ගොස් ඇති බව වැඩිදුරටත් නිරීක්ෂණය විය. | බී කලාපයේ, අරලගංවිල බීජ ගොවිපලෙහි අලිවැට ඉදිකිරීම් සඳහා නවනිපැයුම්කරුවන්ගේ කොමිසම වෙත ලබාදුන් රු.4,840,272.41 ක වටිනාකමකින් යුත් අත්තිකාරම් මුදල් මේ වන විට පියවා ඇත.<br><br>බී කලාපයේ කරපොල, කන්දකාඩු සිංහපුර අතර අලිවැට ඉදිකිරීම් සඳහා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම වෙත ලබාදුන් රු.9,239,319.60 ක වටිනාකමින් යුත් අත්තිකාරම් මුදල් පියවීම සඳහා තාක්ෂණික වාර්තා (මැණුම් පත්‍රය - Measurement sheet) ඉදිරිපත් නොකිරීම හේතු කොට ගෙන අත්තිකාරම් පියවීම් සිදුකර නොමැත.<br><br>සී කලාපයේ කෘෂිකාර්මික පුහුණු ගොවිපල වටා ඉදිකරන ලැබූ අලිවැට සඳහා ලබා ගත් රු.8,000,000 ක අත්තිකාරම් මුදල් මේ වන විටත් පියවීම් කර නොමැත. නව නිපැයුම්කරුවන්ගේ කොමිසම විසින් පිළියෙල කර ඇති මෙම අලිවැට ඉදිකිරීමේ දී ඇති වූ තාක්ෂණික හා වෙනත් දෝෂ මත මෙය ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් විධිමත්ව භාරගෙන නොමැත. ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමට වෙත උක්ත අලිවැට නැවත ප්‍රතිසංස්කරණය කරදෙන ලෙස දැනුම් දී ඇත. | නිම නොකරන ලද වැඩ නිම කොට කඩිනමින් අත්තිකාරම් පියවා ගැනීමට අවශ්‍ය කටයුතු කළයුතු අතර, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයෙන් බැහැරව අත්තිකාරම් ලබාදීමට වගකිවයුතු නිලධාරීන් සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ග ගෙන රජයට සිදුවූ පාඩුව අයකර ගැනීමට කටයුතු කළයුතුය. |

### 3.7 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වලව කලාපය තුළ කොට්ඨාශ කාර්යාල 10 ක් පැවතියද අඩු ආදායම්ලාභීන්ට ආධාර ලබාදීම යටතේ වැසිකිළි සාදා දීම සඳහා කලාපයට වෙන් කරන ලද රු.මිලියන 27.5 ක සම්පූර්ණ මුදලම කොලොන්න කාර්යාලය වෙත ලබාදී තිබුණි. එමෙන්ම මෙම වැසිකිළි සාදාදීමේදී මීට පෙර භාවිතා | කොළොන්න කොට්ඨාසයේ වැසිකිළි ඉදිකරදීමේ ක්‍රියාකාරකම සඳහා 2815 වැය ශීර්ෂයෙහි අනු අංක 3.1.9 යටතේ රු:මි 31.040 ක මූලා ප්‍රතිපාදන වෙන් කර තිබූ අතර එම ක්‍රියාකාරකම ගොවි සංවිධාන වෙත කොන්ත්‍රාත් පිරිනැමීමක් මඟින් ඉටු කර ගැනීමට කටයුතු සැලසුම් කරන ලදි. | අනිකුත් කලාපවල ක්‍රියාත්මක කර ඇති අයුරින් ප්‍රතිලාභියා වෙත පියවරෙන් පියවර මුදල් ලබාදීමටත්, සුදුසුම පුද්ගලයින් |

| | | | |
|---|---|---|---|
| | කරන ලද ක්‍රමවේදයන් අනුව ප්‍රතිලාභියා හට එම ආධාර මුදල් ලබා නොදී ගොවි සංවිධාන වෙත කොන්ත්‍රාත් ප්‍රදානය කිරීම හේතුවෙන් එක් වැසිකිළියක් සඳහා රු.122,452 ක මුදලක් වැඩිපුර ලබාදී තිබුණි. තවද මේ සඳහා ප්‍රතිලාභීන් තෝරා ගත් ආකාරය විගණනයට ඉදිරිපත් නොවූ අතර, විගණනය විසින් සිදුකළ නියැදි පරීක්ෂාවේදී එයින් අඩු ආදායම්ලාභීන් නොවන පුද්ගලයින්ටද ආධාර ලබාදී තිබූ බව නිරීක්ෂණය විය. | | නිසි කමිටුවක් මඟින් හඳුනා ගැනීමටත් කටයුතු කළයුතුය. නුදුසුදු පුද්ගලයන්ට ආධාර ලබාදීම සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වා තෝරා ගැනීමට වගකිවයුතු නිලධාරීන්ට විනය ක්‍රියාමාර්ග ගතයුතුය. |
| (ආ) | බකමූණ බස් නැවතුම්පොල ඉදිකිරීම කොන්ත්‍රාත් ගිවිසුම අනුව 2022 අප්‍රේල් 04 දින නිම කළයුතු වුවත්, 2025 මැයි 20 වන විට ඉදිකිරීම් අත්හැර දමා තිබුණි. | මෙම කොන්ත්‍රාත්තුව, ඉදිකිරීම් අමුද්‍රව්‍ය මිල ගණන්වල සිදු වූ සීඝ්‍ර වර්ධනය හා රට තුළ ඇති වූ ආර්ථික අර්බුදය හමුවේ මුදල් ප්‍රතිපාදන නොමැති වීමෙන් දෙපාර්ශවයේ එකඟතාවය මත 2023.05.12 දින අවලංගු කර ඇත.<br><br>අනුමත නගර සැලැස්ම ලද විගස ක්‍රියාත්මක සැලැස්ම සකස් කිරීමේදී ඒ සඳහා ප්‍රතිපාදන වෙන් කර යෝජිත බස් නැවතුම්පල කටයුතු ආරම්භ කරන බව දන්වා සිටිමි. | සැලසුම් කළ කාර්යය නිම කිරීමට කටයුතු කළයුතුය. |
| (ඇ) | රත්කිඳ සංචාරක බංගලාව අලුත්වැඩියාව සඳහා 2018 දෙසැම්බර් 24 දින රු.මිලියන 12.11 කට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණද, කොන්ත්‍රාත් ගිවිසුම අනුව 2019 ජුලි 19 දින වනවිට වැඩ නිම කළයුතු වුවත් කොන්ත්‍රාත්තුව අතහැර දමා තිබුණි. මීට අදාළව කොන්ත්‍රාත්කරුට රු.මිලියන 3.45 ක වැඩ ආවරණය කිරීමේ අත්තිකාරමක් ගෙවා තිබුණ අතර, මේ වනවිට බැංකු ඇපකරයේ කාලසීමාව ඉක්මවා ගොස් තිබීම හේතුවෙන් එම මුදල හානි පූරණය කරගැනීමට අධිකාරියට නොහැකිවී තිබුණි. | මෙම කොන්ත්‍රාත්තුව අවලංගු කිරීමෙන් පසු මේ පිළිබඳව (CGF) අරමුදල සමඟ සාකච්ඡා කිරීමෙන් සංචලන අත්තිකාරම් මුදල ලෙස අයවිමට තිබූ ඉතිරි මුදල වන රු.1,536,926.33 ක් සහ කාර්යසාධන ඇපකර මුදල වන රු.605,390 ක මුදල 2024.09.12 දින අයකර ගන්නා ලදි.<br>රටෙහි ඇතිවූ ආර්ථික අර්බුදය හේතුවෙන් 2022,2023 සහ 2024 වර්ෂවලදී නව ඉදිකිරීම් සඳහා ප්‍රමාණවත් මුදල් ප්‍රතිපාදන වෙන් නොවූ අතර ඉදිරියේ දී මේ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන වෙන්වූ පසු මෙම කාර්යය අවසන් කළහැකි වේ. | කොන්ත්‍රාත්කරුට එරෙහිව නෛතික ක්‍රියාමාර්ග ගැනීමටත්, සිදුවූ පාඩුව අයකර ගැනීමටත්, වගකීම් විරහිතව ක්‍රියාකර ඇති නිලධාරීන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගැනීමටත්, නිම නොකරන ලද වැඩ කොටස් පරීක්ෂා කර කඩිනමින් නිම කිරීමටත් කටයුතු කළයුතුය. |
| (ඈ) | මධ්‍යම පරිසර අධිකාරියට අයත් කුණ්ඩසාලේ වරාපිටිය ප්‍රදේශයේ පිහිටි ඉඩමක නව ගොඩනැගිල්ලක් ඉදිකර දීම වෙනුවෙන් ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් ගිවිසුම් ගතවීමකින් තොරව | මෙම කාර්යය සඳහා වූ ඇස්තමේන්තුගත මුදල වන රු.32,096,839.32 ක මුදල පළමු අදියර වශයෙන් බිම් මහලේ ස්ලැබ් (Slab Level) මට්ටම දක්වා ඉදිකිරීම සඳහා පමණක් ඉදිරිපත් කර ඇත. මෙම | ගිවිසුම්ගත නොවී කොන්ත්‍රාත් ප්‍රදානය කිරීම සම්බන්ධයෙන් වගකිවයුතු |

| | | | |
|---|---|---|---|
| | ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය වෙත රු.මිලියන 32.1 ක කොන්ත්‍රාත්තුවක් ප්‍රදානය කර තිබුණි. කෙසේ වෙතත් ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම මත එකඟවූ පරිදි මහල් 04 කින් යුතු ගොඩනැගිල්ල ඉදි නොකර බිම් මහල පමණක් ඉදිකර තිබූ අතර, එයද අසම්පූර්ණ ලෙස අවසන් කර තිබුණි. මේ හේතුව නිසා මධ්‍යම පරිසර අධිකාරිය අදාළ ගොඩනැගිල්ල 2025 මැයි 20 වන විටත් භාරගෙන නොතිබුණි. | ගොඩනැගිලි කාර්යාලය ඉදිකිරීමේ ඉතිරි වැඩ කටයුතු සඳහා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබී ඇති හෙයින්, ඉදිරියේ දී මධ්‍යම පරිසර අධිකාරිය වෙත ප්‍රතිපාදන ලැබීමෙන් පසු ඉදිකිරීම් කඩිනමින් අවසන් කර එම කාර්යාලයේ කටයුතු ආරම්භ කිරීමට අපේක්ෂිත බව එම අධිකාරිය දන්වා ඇත. තවද මෙම ගොඩනැගිල්ලේ ඉදිකිරීම් අවසන් කිරීමට අවශ්‍ය ප්‍රතිපාදන ලබාගැනීමට මධ්‍යම පරිසර අධිකාරිය මගින් 2021/10/06 වන දින අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කර ඇති අතර මේ සඳහා අමාත්‍ය මණ්ඩලයේ තීරණය වනුයේ දැනට පවතින කාර්යාල ඉඩපහසුකම් කළමනාකරණය කරගන්නා ලෙස දන්වා ඇති බවයි. | නිලධාරීන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගතයුතුය. ඉදිකළ මහල සම්පූර්ණ කරවා ගැනීමට කටයුතු කර ගොඩනැගිල්ල භාවිතයට ගැනීම කළයුතුය. |

**3.8 මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2024 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ තනතුරු 147 ක් සඳහා අනුමත කාර්ය මණ්ඩලය 4859 ක් වූ අතර එදිනට තනතුරු 113 කට අදාළව පැවති පුරප්පාඩු සංඛ්‍යාව 1517 ක් විය. ඒ අනුව එම පුරප්පාඩු සංඛ්‍යාව අනුමත කාර්ය මණ්ඩලයෙන් සියයට 31 ක් වැනි ඉහළ අගයක් ගෙන තිබුණි. | භාණ්ඩාගාර ලේකම්ගේ "රාජ්‍ය වියදම් පාලනය කිරීම" යන මැයෙන් නිකුත් කරන ලද ජාතික අයවැය චක්‍රලේඛ අංක. 03/2022 හා 2022.04.26 වන දිනැති හා අයවැය චක්‍රලේඛ අංක. 05/2022 හා 2022.09.02 වන දිනැති ලිපි මගින් රාජ්‍ය වියදම් දැඩි ලෙස පාලනය කිරීම සම්බන්ධයෙන් ලද උපදෙස් පරිදි අධිකාරියේ පැවති පුරප්පාඩු 2022 වර්ෂයේ සිට පිරවීම තාවකාලිකව අත්හිටුවීමත්, බොහෝ පිරිසක් එම කාලවකවානුව තුළ විශ්‍රාම යාම, විදේශගත වීම හා සේවයෙන් ඉල්ලා අස්වීමත් හේතුවෙන් පුරප්පාඩු ප්‍රතිශතය ඉහළ අගයක් ගෙන තිබුණි. | පවතින පුරප්පාඩු සමාලෝචනය කර අවශ්‍ය නිලධාරීන් පත් කර ගැනීමට කටයුතු කළයුතුය. |
| (ආ) | අනුමත නොවූ තනතුරු 06 ක් සඳහා ස්ථිර පදනමින් නිලධාරීන් බඳවා ගෙන තිබුණද, එම තනතුරු විධිමත් පරිදි අනුමත කර ගැනීමට අධිකාරිය සමාලෝචිත වර්ෂය තුළද කටයුතු කර නොතිබුණි. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 25/2014 හා 25/2014 (I) අනුව අධිකාරියේ කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) සේවා ගණයේ (MA 1-2) සිට ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණය (PL 1) දක්වා අඛණ්ඩව දින 180 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සේවකයින්ට ස්ථිර පත්වීම් ලබා දී ඇත. එම පත්වීම් ලබා දීමෙන් අනතුරුව ඒ ඒ ආයතනවල කාර්ය මණ්ඩල යාවත්කාලීන කිරීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත අදාළ තොරතුරු ඉදිරිපත් කරන ලෙස එම චක්‍රලේඛය මගින් උපදෙස් ලබා දී ඇති අතර, ඒ අනුව ඊට අදාළ තොරතුරු යොමු කිරීමෙන් පසු එම | අනුමත තනතුරුවලට පමණක් බඳවා ගැනීමටත්, අනුමත නොවූ තනතුරු අනුමත කර ගැනීමටත් කටයුතු කළයුතුය. |

ලිපිය ලද බවට පමණක් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් දන්වා ඇත.

### 3.9 වාහන පද්ධති කළමනාකරණය

| විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ වලව නේවාසික ව්‍යාපාර කළමනාකරණ කාර්යාලයට අනුයුක්ත කර තිබුණු කැබ් රථයක් වර්ෂ 2004-2005 කාලය තුළ අනුමැතියකින් තොරව බාහිර පාර්ශවයක් වෙත ලබාදී ඇති බව ඉකුත් වර්ෂවල විගණන වාර්තා මඟින් පෙන්වා දී තිබුණද, ඒ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. එසේම අධිකාරිය විසින් ජනාධිපති ලේකම් කාර්යාලයට ලබාදී තිබූ ඩබල් කැබ් රථයක්ද 2024 දෙසැම්බර් 31 දින දක්වා ආපසු ලබාගැනීමට කටයුතු කර නොතිබුණු අතර, රථය ජනාධිපති ලේකම් කාර්යාලයට ලබා දුන් දිනය තහවුරු කර ගැනීමට සාක්ෂිද විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | 2004-2010 අතර කාලසීමාවේදී ගරු මහවැලි සංවර්ධන අමාත්‍යතුමාගේ කාර්යය මණ්ඩලය වෙත මෙම වාහනය ලබාදී ඇති බව සනාථ වන බැවින්, මෙම වාහනය නැවත මෙම අධිකාරිය වෙත පවරා ගැනීම සඳහා අවශ්‍ය නෛතික ක්‍රියාමාර්ග ගැනීම සඳහා අවශ්‍ය නීති උපදෙස් ලබා ගැනිම සඳහා නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමුකර ඉදිරි කටයුතු සිදු කෙරෙමින් පවතී.<br><br>තවද විශේෂ අපරාධ විමර්ශන අංශය (ඇඹිලිපිටිය) මගින් විමර්ශන කටයුතු ආරම්භ කර ඇති අතර දැනට සේවයේ සිටින නිලධාරින් සහ විශ්‍රාමික නිලධාරින් අවස්ථා කිහිපයකදි විමර්ශන කටයුතුවලට අදාළව තොරතුරු ලබා ගැනිම සඳහා කැඳවීම් සිදු කර ඇත.<br><br>මෙම කැබ් රථය අස්ථානගත විම සම්බන්ධව මුදල් රෙගුලාසි 104 (1) අනුව කටයුතු කිරීමට අමාත්‍යාංශ ලේකම් දැනුවත් කළ අතර අමාත්‍යාංශ ලේකම් විසින් ඒ සම්බන්ධව මුදල් රෙගුලාසි 104 (1) පරික්ෂණ කටයුතු සිදු කිරිම සඳහා කමිටුවක් පත් කර අදාළ පරීක්ෂණ කටයුතු කරගෙන යයි. | බාහිර පාර්ශව වෙත වාහන බැහැර කිරීම සම්බන්ධයෙන් වගකිවයුතු නිලධාරීන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගතයුතුය. ජනාධිපති ලේකම් කාර්යාලයට ලබාදී ඇති වාහන ආපසු ලබාගැනීමට හෝ එම කාර්යාලයට පැවරීමට කටයුතු කළයුතුය. |